# අනුරාධපුරයේ මහා ස්තූප ඉදිකිරීම හා පසුකාලීන් මැදිහත්වීම් පිළිබඳ ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක විමර්ශනයක්

*වික්‍රි බණ්ඩාර විජේපාල*

## ප්‍රවේශය

ක්‍රි.පූ. තුන්වන සියවසේ දී ඉන්දියානු බෞද්ධ සංස්කෘතිය මෙරට පැවති දේශීය සංස්කෘතියට ඍජු ලෙස බලපෑම් සිදු කොට නවමු ආගමික සංස්කෘතියක් මෙරට ස්ථාපිත කරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස මෙරට තුළ සුවිශේෂී ආගමික වාස්තුවිද්‍යා ඉදිකිරීම් සම්ප්‍රදායක් උත්පාදනය විය. මුලින් ස්වාභාවිකව පිහිටි ලෙනක් ශුද්ධ පවිත්‍ර කොට, අවශ්‍ය තන්හි බිත්ති ද බැඳ, ලෙනට ඉහළින් කටාරමක් ද කොටා, සිව් දිගින් පැමිණි නොපැමිණි භික්ෂු සංඝයා වෙත පූජා කිරීමේ ක්‍රමය කාලීනව විපර්යාසයට භාජනය වෙමින් විහාර සම්ප්‍රදාය පමණක් නොව විහාරයේ සැකැස්ම ද වෙනස් කරන ලදි. මෙලෙස සංස්කරණය වූ විහාර සම්ප්‍රදායයන් හි බෝධිඝර, ප්‍රතිමාඝර, පැන්මඩු, භෝජන ශාලා, ආසනඝර, උපෝසථඝර, භික්ෂු ආවාස ගෙවල්, ථූප හා ථූපගෙවල් මෙන්ම පිරිවෙන් සඳහාම වෙන් කරන ලද ස්මාරක විය (Silva, 1988, 11).

ඒ අතරින් 'ස්තූප' වෙත හිමි වූයේ සුවිශේෂී ස්ථානයකි. පැරණි සිංහල බසින් තුබ හෝ තුඹ යනුවෙන් හැඳින් වූ මෙහි ජනප්‍රිය ම වචනය නම් 'දාගැබ' යන්නයි. ඊට හේතු වූයේ දාගැබ යන වචනාර්ථයෙන් සධාතුක හෙවත් ධාතු සහිත යන්න ද්වනිත වීමයි. අනෙක් ප්‍රධාන ව්‍යවහාරයක් වූයේ 'වෙහෙර' යන්නයි. වෙහෙර යන වචනාර්ථය කෙසේවත් ස්තූපයක් සඳහා බැවහර වීමට යෝග්‍ය නොවූයේ එයින් විහාරය යන්න කියැවෙන බැවිනි. නමුත් පැරණි විහාරයක ප්‍රධාන අංගය වූයේ ස්තූපය බැවින් ඒ සඳහා වෙහෙර යන්න යෙදී ඇති බව ද පැහැදිලි ය[1]. චෛත්‍ය හෝ චේති යනුවෙන් වූ හැඳින්වීම ස්තූපයක් සම්බන්ධයෙන් පැරණිතම විග්‍රහය විය හැකි බව රෝලන්ඩ් සිල්වාගේ අදහසයි (Silva, 2004, 5). කෙසේ නමුත් විවිධ අවධීන්හි නොයෙක් නම්වලින් හඳුන්වනු ලැබූ මෙම නිර්මාණය ජනතාවගේ නිබඳ ගෞරවයට පාත්‍ර වූ ස්මාරක විශේෂයක් බව පැහැදිලි ය.


සමස්ත ශ්‍රී ලංකාව තුළ ව්‍යාප්තව පවත්නා ස්තූප, බඳෙහි ස්වභාවය අනුව බුබ්බුලාකාර, ඝණ්ඨාකාර, ධාන්‍යාකාර, ඝටාකාර, පද්මාකාර, අම්ලාකාර, පලන්ද්වාකාර (පරණවිතාන, 1946, 45; සිරිසෝම, 1993, 8; Ancient Ceylon 1990, Vol.5, 125-147; Silva, 2004, 25-28; Silva, 1988, 32-36) යනුවෙන් වූ ප්‍රමුඛ ආකාර හතකින් යුක්ත වූ අතර, මෑතක දී හඳුනා ගන්නා ලද ස්තූප වර්ගයක් ලෙස 'කොටවෙහෙරාකාර ස්තූප' යන්න හඳුනා ගත හැකි ය. හුදෙක් මෙය ඓතිහාසික වචනයක් නොවන අතර, තාක්ෂණය, අමුද්‍රව්‍ය, ස්තූපය ඉදිකිරීමේ කාලය, අනුග්‍රහය, වැනි ප්‍රධාන සාධකවල විෂමතා හේතුවෙන් ඇති වූ අසම්පූර්ණ ස්තූප නිර්මාණ ස්වභාවයකි. සාපේක්ෂ නිර්ණයේ දී ස්තූපයේ ප්‍රමාණාත්මක සාධක විශාල, මධ්‍යම හා කුඩා වශයෙන් ආකාර කිහිපයකින් ම හඳුනා ගත හැකිය. මේ එකිනෙකක් නිර්මාණය වීමේ

---

1 'දෙනා වෙහෙර්', 'දෙනා රජමහ වෙහෙර්' (EZ., I, 1912, 218; EZ., II, 1985, 46; EZ., III, 1989, 132; EZ., III, 1989, 227), 'දෙනාවෙහෙර' 'දේනාවෙහෙර' 'දෙනානක ථූවය' 'දෙනානකය' 'දෙනානක නම් සෑය' 'ජේතවන මහ වෙහෙර' 'දෙනා රජ් මහවෙහෙර්' 'ජෙවන විහෙර' (දීව., xiv, 45; සම.පා.,66; වංස.ප. 1994, 281-282; පූව., 1986, 781: පැරකුම්බා සිරිත, 1997, 27; රාජරත්නාකරය, 1995, 86; කුලතුංග, 2004[අ]; සේනානායක, 2015, 11) යනා දී නම් බොහොමයක් ම මේ විහාර සංකීර්ණය හැඳින්වීම සඳහා භාවිතයෙහි යෙදී ඇත. 'දෙව්නා මහ වෙහෙර' 'දෙනානක' (වත්තල, 1994, 21), 'ජෙවන වෙහෙර' (හෙට්ටිආරච්චි, 2009, 113) යනා දී නාමයන් ද ඒ අතර වේ.

ඓතිහාසික වටපිටාව වෙනස් වනවා සේම ඒවා නඩත්තු කිරීමේ හා පවත්වා ගැනීමේ ස්වභාවයන් ද වෙනස් වේ. කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ ස්තූපවලට වඩා වැඩි ජනප්‍රසාදයක් හිමි කර ගැනීමට මහා ස්තූප අතීතයේ පටන් සමත්ව තිබේ. ඕනෑම ස්තූපයක් කෙරෙහි බැඳී පවත්නා ආගමික හා දේශපාලනික වටපිටාව එහි පැවැත්ම හා ප්‍රජා අවධානය කෙරෙහි ඍජු ලෙස බලපායි.

මෙහි දී සාකච්ඡාවට බඳුන් වන්නේ අනුරාධපුරයේ මහා ස්තූප අතරින් හතරක් වන මිරිසවැටිය, රුවන්වැලිය, අභයගිරිය හා ජේතවනය යන ස්තූප හතර පිළිබඳවයි (සිතියම 01). යුරෝපා ජාතීන් ශ්‍රී ලංකාවට පැමිණීම දක්වා විවිධ කාල වකවානුවල දී එම මහා ස්තූප කෙරෙහි වූ මැදිහත්වීම් මට්ටම් ද, තාක්ෂණික විධික්‍රම ද, එම විධික්‍රමවල හිතකර අහිතකරතා ද විවිධ ආකාර ගෙන තිබේ. මේ තත්ත්වයන් පුරාවිද්‍යාත්මක හා ඓතිහාසික සන්දර්භයන් කෙරෙහි අවධානයෙන් සාකච්ඡා කිරීමට මෙම පර්යේෂණයේ දී අවධානය යොමු වී ඇත.




සිතියම 01. අනුරාධපුරයේ මහා ස්තූපවල පිහිටීම දැක්වෙන විස්තරාත්මක

## විමර්ශනය

### අනුරාධපුරයේ මහා ස්තූප ඉදිකිරීම

ශ්‍රී ලංකාවේ ස්තූපයේ ප්‍රභවය පිළිබඳ අදහස් කිහිපයක් ම වංසකතා ඉදිරිපත් කලත්, අනුරාධපුරයේ ඉදිකරන ලද මුල්ම ස්තූපය ලෙස පුරාවිද්‍යාඥයින්ගේ පිළිගැනීමට ලක් ව ඇත්තේ ථූපාරාම දාගැබයි. ඉන් අනතුරුව මෙරට ස්තූප තැනීමේ කලාව ද වාස්තු ශෛලිය ද ඉන්ජිනේරුමය ශක්‍යතාවන් ද වර්ධනය කරගනිමින් කෙටි කාලයක් ඇතුළත ප්‍රමාණයෙන් විශාල ස්තූප තැනීම කෙරෙහි ශිල්පීන්ගේ හා දායක ප්‍රජාවගේ අවධානය යොමු වී ඇත. මෙහි කේන්ද්‍රස්ථානය අනුරාධපුරයය වූ අතර, එහි දේශපාලන මධ්‍යස්ථානය (ඇතුල් නුවර) වටා ස්තූපය කේන්ද්‍ර කර ගත් ආරාම සම්ප්‍රදායයක් ලෙස මහා විහාර පහක් නිර්මාණය වී ඇති ආකාරය හඳුනාගත හැකි ය. රුවන්වැලි ස්තූපය කේන්ද්‍ර කරගත් මහාවිහාරය, අභයගිරි ස්තූපය කේන්ද්‍ර කරගත් අභයගිරි මහාවිහාරය, ජේතවන ස්තූපය මධ්‍යය කර ගත් ජේතවන මහාවිහාර පරිශ්‍රය, මිරිසවැටි ස්තූපය කේන්ද්‍ර කරගත් මිරිසවැටිය මහාවිහාරය හා දක්ඛිණ ථූපය කේන්ද්‍ර කර ගත් දක්ඛිණ මහා විහාරය ලෙස ඒවා පෙන්වා දිය හැකි ය. මහාවිහාර අතරින් දක්ඛිණ ථූපය හැරෙන්නට සෙසු ස්තූප හතර පිළිබඳව මෙහි දී සාකච්ඡාවට බඳුන් වී ඇත.

### මිරිසවැටි දාගැබ්කරණය

'ස්තූප' තැනීම 'මහා ස්තූප' තැනීම දක්වා පුළුල් ස්වභාවයක් ගත් අතර, මේ මහා ස්තූප තැනීම සම්බන්ධයෙන් පුරෝගාමී වූයේ දුටුගැමුණු රජු (ක්‍රි.පූ. 161-137) ය. මෙහි දී සාකච්ඡා කරන මිරිසවැටිය හා රුවන්වැලි ස්තූප එතුමාගේ මූලිකත්වයෙන් කරන ලද මහා නිර්මාණයන් අතර කැපී පෙනෙයි. වංසකතාව අනුව වසර 44ක එළාර පාලනය මුලිනුපුටා දැමූ දුටුගැමුණු රජු මෙරට අගනුවර වූ අනුරාධපුරය සිංහල පාලකයෙකු යටතට පවරා ගන්නා ලදි. පෙර රජ සිරිත අනුව රාජ්‍යත්වයෙන් සත් දිනකට පසුව සේනාව පෙරටු කොට ගත් රජු තිසා වැවෙහි මහත් උත්සවශ්‍රීයෙන් පැවති ජල ක්‍රීඩා උළෙලකට සහභාගී වී ඇත. යම් තැනෙක රජුගේ නොයෙක වූ පරිභෝග භාණ්ඩ ද ධාතු සහිත කුන්තායුධය (රාජකීය යෂ්ටිය, ජය කොන්තය) ද පිහිටුවා දුටුගැමුණු රජු උත්සවය සඳහා යොමු වී තිබේ. ජලස්නාන උත්සවයෙන් අනතුරුව එම ස්ථානයෙන් බැහැර වීමට යන මොහොතේ දී ජය කොන්තය රැගෙන එන ලෙස රජු අණ කලත් එය තිබූ තැනින් කවර ලෙසකින් හෝ සෙලවීමට නොහැකි වී ඇත. මෙය ආශිර්වාදයක් සේ සැළකූ රජු සධාතුක ජයකොන්තය එම ස්ථානයේ ම පිහිටුවා ස්තූපයක් තැනවීමට තීරණය කර තිබේ. එය නම් වර්තමානයේ තිසා වැව ආසන්නයෙන් ම පවත්නා මිරිසවැටි ස්තූපය[2] යි.

ගෙවුනු තුන් වසරකින් අනතුරුව දහනව කෝටියක් ධනය වැය කොට හාත්පස වූ ආවාස පරිශ්‍රය ද සමගින් මෙම අතිශය ප්‍රභාමත් වූ මිරිසවැටි ස්තූපය තනවා අවසන් කරයි (මව., 26, 23-25). ස්තූපය මහා සංඝයා වෙනුවෙන් පූජා කිරීමේ උත්සවයට ඉන්දියාවෙන් හා ලංකාවේ නන් දෙසින් ගෙන්වා ගන්නා ලද භික්ෂූන් වහන්සේලා දහස් ගණනක් සහභාගී වූ බවත්, දින සතක් පුරා මේ උත්සවය පවත්වා ඇති බවත් මූලාශ්‍රය පෙන්වා දෙයි (එම., 26, 16; රත්නායක, 2009, 63).

කඹුරුපිටියේ වනරතන හිමියන් පෙන්වා දෙන්නේ දුටුගැමුණු රජු සමග තිස්සාරාමයේ සිට යුධ පෙරමුණෙහි වැඩම කළ භික්ෂූන් වහන්සේලා 500නම වෙනුවෙන් මේ මිරිසවැටි පූජාව සිදු කරන්නට ඇති බවයි (වනරතන හිමි, 1970). පැරණි මූලාශ්‍රයන්හි මෙම දාගැබේ හැඩය, ප්‍රමාණාත්මක සාධක හෝ වෙනත් වාස්තුවිද්‍යාත්මක අංග පිළිබඳව සැළකිය යුතු මට්ටමේ තොරතුරු ප්‍රමාණයක් අන්තර්ගත නොවේ. වර්තමානයේ හඳුනා ගත හැකි සාධක අනුව පේසා වළලු 3කින් සමන්විත දාගැබ් පාදමේ විශ්කම්භය මීටර් 42.30කි. සළපතල මළුවේ දිග හා පළල මීටර් 84 බැගින් වූ සමාන ප්‍රමාණවලින් යුතුය (වගුව 01). ඊට පිටතින් වූ සීමා ප්‍රාකාරය සලපතළ මළුව මට්ටමේ සිට සෙ.මී. 80ක උසකින් යුතු වේ. එම සීමා ප්‍රාකාරයට පිටතින් පහතින් වූ වැලි මළුව මීටර් 17ක පමණ පළලින් යුතු වේ. පේසා වළලු

2 මිරිසවැටි ස්තූපය නිර්මාණය කිරීමේ නිමිත්ත ඒ පරිදි වුවත් ඒ සඳහා මිරිසවැටි නාමය වැවහර වූයේ කෙසේ ද යන්නත් මහාවංසයේ පෙන්වා දෙයි. ........ ඒ නරේශ්වර තෙම විහාර පූජා කරණයෙන් සංඝයා රැස් කර වූයේය. එ දවස රැස් වූ භික්ෂූන් ලක්‍ෂයක් වූහ. භික්ෂුණීහි ද අනූ දහසක් වූහ. මිහිපල් තෙම ඒ සමාගමයෙහි දී සංඝයාට මෙය සැල කළේය. ''වහන්ස සංඝයා සිහි නොකොට මිරිස් වැටියක් අනුභව කළෙමි. ඊට දඬුවම වෙවයි චෛත්‍යය සහිත වූ අතිශයින් සිත්කළු වූ මිරිස්වැටි වෙහෙර කරවීමි. එය සංඝ තෙමේ පිළිගන්නා සේක්වා'' ....... (මව., 26:6-18).

ද සමගින් ස්තූපයේ උස මීටර් 57.60කි (හෙට්ටිආරච්චි, 2009, 15). මේ මට්ටමට මිරිසවැටි ස්තූපය ආරම්භක අවස්ථාවේ පටන් පැවතියේ යයි විශ්වාස කළ නොහැක. අනිවාර්යයෙන් සෙසු ස්තූප පරිදි ම මෙයත් කලින් කල විශාල කිරීම්, කංචුක එකතු කිරීම් ආදියට නතු වීමෙන් වර්තමාන තත්ත්වයට පත් වන්නට ඇත.

## රුවන්වැලි දාගැබ්කරණය

ප්‍රථම මහා ස්තූපය ඉදි කිරීමෙන් අනතුරුව දෙවන මහා ස්තූපය ඉදි කිරීමේ කටයුතු ආරම්භ කරන ලද්දේ ද දුටුගැමුණු රජු විසින්ම ය. එසේ මහින්ද මහ රහතන් වහන්සේ විසින් පෙන්වා දුන්, දේවානම්පිය තිස්ස රජු විසින් ටැම් සිටුවා වෙන් කරන ලද භූමියෙහි රජු විසින් නිමිති තහවුරු කර ගනිමින් රුවන්වැලි ස්තූපය[3] ඉදි කිරීමේ කටයුතු ආරම්භ කරන ලදි (ජයවර්ධන, 1991, 68). අමුද්‍රව්‍ය එක් රැස් කිරීමෙන් අනතුරුව රජු වෙසක් මස පුර පසළොස්වක් පොහෝ දිනයෙක විසා නැකතින් කම්කරුවන් යොදවා අත්තිවාරම් කැපීම ආරම්භ කළ බව වංශකතාව පෙන්වා දෙයි. ඊට අනුව මේ අයුරින් පොළොව රියන් සතක්[4] යටට කැණ තිබේ. අත්තිවාරම ශක්තිමත් කිරීම සඳහා යෙදූ කළු ගල්, සිය පාද ආරක්ෂා කර ගැනීම සඳහා යෙදූ සම් ආවරණ සහිත අලි ඇතුන් ලවා පාගවා ශක්තිමත් කළ බව පැවසේ (මව., 29, 1-4). මෙහි දී පාදම ශක්තිමත් කර ගැනීම සඳහා වර්තමානයේ යොදා ගන්නා වූ කොන්ක්‍රීට් පදනමකට සමාන වූ ශක්තියක් අපේක්ෂා කළ බව මහාවංසයේ 29වන පරිච්ඡේදය වඩාත් විමසිල්ලෙන් බැලීමේ දී පෙනී යයි. එහි දී,

- පොළොව මට්ටමේ සිට රියන් සතක් යටට කැණීම.
- සුණු ගල් කුඩු කර ඒ මත හෙලීම හා ඇතුන් ලවා පෑගවීමෙන් භූමිය ගන බවට පත් කිරීම.
- වෙඬරු (නවනීත) මැටි නමින් හඳුන්වන වඩාත් සියුම් මැට්ටක් ඇතිරවීම. වංසත්ථප්පකාසිනියට අනුව කුස්තුර මැකී යන පරිදි මෙසේ මැටි ඇතිරීම සිදු කර තිබේ (වංසත්ථප්පකාසිනී, 2001, 411).
- ඒ මත ගල් ඇතිරවීම.
- ශුද්ධ වූ කරගල් තට්ටුවක් යෙදීම (මව. සුමංගල දේවරක්ෂිත) මෙම කරගල් යන්න වංසත්ථප්පකාසිනියේ (2001, 411) හා ආනන්ද ගුරුගේ මහතා (මහාවංසය, 2007) විසින් අරුත් ගන්වන්නේ ගඩොල් ලෙසයි. මේ සඳහා පුළුස්සන ලද ගඩොල් විශේෂයෙන් භාවිත කරන ලද බව පැවසීම සඳහා මෙය යොදන්නට ඇත. මෙයින් මේ සමය වන විට නොපුළුස්සන ලද ගඩොල් ඉදිකිරීම් කටයුතු සඳහා යොදා ගන්නට ඇති බවට ද ඉඟි ලබා දෙයි. මේ ගඩොල් තට්ටුව මත බොල් බොරළු තට්ටුව කැට මුසු ගල් තට්ටුවක් සේ රළු පහස ඇති හුණු බදාම තට්ටුවක් ද ඇතිර වූ බව මහාවංස ටීකාකරු පෙන්වා දෙයි (වංසත්ථප්පකාසිනී, 2001, 411).
- කුරුවින්ද[5] නම් පාෂාණ තට්ටුවක් ඇතිරවීම.
- යකඩ දැලක් එළීම.

---

3 වංසකතාවල හා සෙල්ලිපි මූලාශ්‍රවල මහතුබ (IC., 1983, 74,111), මහචෙය හෝ මහචෙත (do., 197, 221), මහාචේතිය (දීව., 10:19), මහාථූප (මව., 23-26 පරි.; 34:23; දීව., 20:1,5,10; 21:1,13,18,21,25,26, 22:35,25,38,46, 47,50,60) , හේමමාලි (මව., 15:166-167), සුවණ්ණමාලී, සොණ්ණමාලී, රත්නමාලී, රත්නමාලිකචේතිය (හෙට්ටිආරච්චි, 2009, 29; ජවර්ධන, 1991, 72), රුවන්මැලි (EZ., IV, 1943, 255), රුවන්වැලි (EZ., II, 1985, 77,108,135), රුවැලි මහ සෑ, රුවන් දාගැබ යනාදී විවිධ නාමයන් මෙම ස්තූපය හැඳින්වීම සඳහා යොදාගෙන තිබේ (හෙට්ටිආරච්චි, 2009, 26-32; ජවර්ධන, 1991, 72).

4 රියන පිළිබඳව විවිධ මතිමතාන්තර තිබේ. රියනක ප්‍රමාණය අඟල් 30ක් හෙවත් අඩි දෙක හමාරක් බව රත්නායක විසින් පෙන්වා දෙයි (රත්නායක, 2009, 70). පරණවිතාන මහාතා *Cey.J.Sci. Section G, Vol. II* ට අනුව පෙන්වා දෙන්නේ පැරණි ශ්‍රී ලංකාවේ භාවිත වූ වඩු රියන දිගින් අඟල් 30ක් පමණ වූ බවයි (පරණවිතාන, 1997, 5). රියනට අඟල් 27ක් බව ශ්‍රීමත් ජේම්ස් එමර්සන් ටෙනන්ට් පෙන්වා දෙයි. එම් බී ආරියපාලට අනුව වඩු රියන අඟල් 24කි. මානසාර නම් වාස්තුවිද්‍යා ග්‍රන්ථයේ රියන් (හස්ත) වර්ග 4ක් පිළිබඳව පවසයි. ඒවා අඟල් 24,25,26,27 ප්‍රමාණවලින් යුතුව තිබේ. මේ හැරෙන්නට අඟල් 18කින් යුතු රියනක් ද ලංකාවේ භාවිතව ඇත (වික්‍රමගමගේ, 1986, 15).

5 ආනන්ද ගුරුගේ මහතාට අනුව මේ නමින් හඳුන්වා ඇත්තේ තිරුවාණ පාෂාණයි (මහාවංසය 2007:556). නමුත් මහාවංස ටීකාකරු එය අර්ථ ගැන්වීමෙහි නොයෙදෙයි.

- ඒ මත බොරළු ඇතිරවීම. මේ සම්බන්ධයෙන් වංසත්ථප්පකාසිනියේ දක්වන්නේ මරුම්බ නම් සුවඳවත් මැටි විශේෂයක් හිමාලයෙන් ගෙන්වා යකඩ දැල මත හෙළූ බවයි (2001, 411). මෙහි දී පැහැදිලි වන ප්‍රධාන කාරණයක් වන්නේ පෙර එළන ලද යකඩ දැල මත යම් මැටි විශේෂයක් යොදන ලද බවයි. කවර ලෙසකින් හෝ ඉදිකරන ලද නිර්මාණයේ ශක්තිය සම්බන්ධයෙන් සැළකීමේ දී මේ අයුරින් මැටි තට්ටුවක් යෙදිය යුතුමය. මන්ද ඒ මත පළිඟු ගල් ඇතිරවූයේ වී නම් ඒ අතර බන්ධන මාධ්‍යයක් සක්‍රීය නොවේ.
- පළිඟු ගල්[6] ඇතිරවීම.
- නැවත ගල් ඇතිරවීම.
- රසදිය හා මිශ්‍ර කළ දිවුල් ලාටු (මැලියම්) ගල් අතර යෙදීම.
- අඟල් අටක් ඝණකම ඇති ලෝහ දැලක් ඒ මත එළීම.
- රත්හිරියල් තල තෙල් සමග මිශ්‍ර කර තට්ටුවක් සේ යෙදීම.
- අඟල් සතක් ඝණැති රිදී දැලක් ඒ මත ඇතිරවීම (මව., 29, 3-12; වංසත්ථප්පකාසිනී, 2001, 410-411; මහාවංසය, 2007, 556-557).

මේ අයුරින් ස්තූප පාදම ශක්තිමත් අයුරින් නිර්මාණය කර ගැනීම සඳහා උපරිම තාක්‍ෂණයක් භාවිත කිරීමට නිර්මාණ ශිල්පීන් කටයුතු කොට ඇති බැව් වංශකතාව අධ්‍යයනයේ දී පැහැදිලි වේ. දෘඪ ගල් මත මෘදු මැටි වැනි දේ යෙදීමෙන් ද ඒවා මත යකඩ දැල් ආදිය යෙදීමෙන් ද පැහැදිලි වන්නේ මෙම දැවැන්ත නිර්මාණයේ කල් පැවැත්ම කෙරෙහි අවධානයෙන් මේ ශිල්පීන් කටයුතු කර ඇති බවයි. නමුත් මෙම දාගැබේ පාදම පිහිටුවා ගත්තේ කුමන පාංශු තලයකදැයි මහාවංසයේ විස්තර නොමැත. එසේ වුව ද දීපවංස විස්තරයකට අනුව පිහිටි ගල් තලය (**ථූලසෙල**) මතුයෙහි සිට[7] මහා ථූපයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබේ. තව ද පාදමේ සිට ගඩොල් භාවිත කරන ලද බවක් මහාවංසයේ විස්තර නොකෙරෙතත්, දීපවංසයේ එබන්දක් විස්තර කරයි (එම). ජේතවන ස්තූපයේ හා අභයගිරි ස්තූපයේ පාදමේ සිටම ගඩොල් භාවිත කර ඇති බව පුරාවිද්‍යාත්මක සාධක තුළින් ද සනාථ වන බැවින්, රුවන්වැලි ස්තූපයේ නිර්මාණාත්මක ස්වභාවය සම්බන්ධයෙන් දීපවංසයේ අනාවරණයන් වඩා විශ්වසනීය ලෙස භාවිතයට ගත හැකි බව පැහැදිලි ය.

මැටි සඳහා නවනීත මැටි[8] පමණක් යොදා ගත් බව මහවංසය විශේෂයෙන් පෙන්වා දෙයි. රසදිය මුසු කළ දිවුල් මැලියම්, තලතෙල් ආදිය බදාම සඳහා යොදා ගන්නට ඇත්තේ බන්ධන සඳහා ය. දීපවංසයට අනුව නම් මේ සඳහා යොදා ගෙන ඇත්තේ 'සක්ඛර'ය[9]. එය ද ශක්තිමත් බදාමයක් ලෙස භාවිත කළ හැකි බව හෙට්ටිආරච්චි මහතා පෙන්වා දෙයි (2009, 34-35). මේ අයුරින් දෙමසක කාලයක් තුළ සිදු කරනු ලැබූ පාදම් නිර්මාණයෙන් ද ශක්තිමත් කිරීමෙන් ද අනතුරුව ස්තූපකරණය සඳහා ගඩොල් තැබීම අති මහත් බහුතරයක් වූ ගිහි පැවිදි පිරිසකගේ සහභාගීත්වයෙන් සිදු කරවා ඇත (මව., 29:15-63). මේසා දැවැන්ත නිර්මාණයක් සඳහා ගඩොල් සපයා ගැනීම ඊළඟ කාර්යය විය.ගඩොල ස්තූපයේ පැවැත්ම පිළිබඳ තහවුරුව සපයන්නා වූ ප්‍රධානතම මූලයයි. රජු මේ සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කර ඇති අතර, මහා පරිමාණ ගඩොල් නිෂ්පාදකයන් පිළිබඳ විශ්වාසයක් නොමැති හෙයින් වඩාත් විමසිලිමත්ව ඇත්තේ තාක්‍ෂණික අතින් වඩාත් උසස් නිර්මාණ සිදු කරන්නන් කෙරෙහි ය. අවසන එබඳු උළු වඩුවෙක්[10] මුණගැසීමෙන් ඔහුට චෛත්‍යකර්මය භාර කර ඇත. ඉන් අනතුරුව

---

6 මේවා තිරිවාන විය හැකි බව හෙට්ටිආරච්චි පෙන්වා දෙයි (2009, 34).

7 "**සුධාභූමි ථූලසේලං මත්තිකං ඉට්ඨිකායච විසුද්ධ භූමිකාවෙ ච අයෝ ජාලං මරුම්බකං**" (දීව., 19:2)

8 සැම තන්හි මැටියෙන් කටයුත්තෙහි නවනීත නම් මැටිම විය (මව., 29:10-11).

9 පාලි ශබ්දකෝෂයට අනුව 'සක්ඛර' යනු උක් සකුරු ය (බුද්ධදත්ත හිමි, 1950, 482).

10 ඉක්බිති පණ්ඩිත ව්‍යක්ත වූ උළු වඩුවෙක් තෙම වනෙහි කොටවා කුල්ලෙන් වැඩූ කල්හි මම දා ගලෙහි අඹරවා මැටි අමුණක් (එක දවස ගෙන්වන්නෙමි) මෙහි චෛත්‍යයෙහි තෘණාදීහු ද නොවන්නාහු යයි නරනිඳුහට කීයේ ය (මව., 30, 9-10). ස්මාරක සංරක්‍ෂණයේ මූලික සංකල්ප ගැබ්ව ඇති මේ ගාථාද්වය උරුම කළමනාකරණය සම්බන්ධයෙන් ද ඉතා වැදගත් වූ ප්‍රකාශයකි. විශේෂයෙන් මූලික ඉදිකිරීමේ දෝශ පවතින්නේ නම් ඉතා කෙටි කාලයකින් ස්මාරකයක් සංරක්‍ෂණ මැදිහත් වීම් වෙත යොමු කරවයි. මේ ආකාර වූ ගඩොල් යොදා ගත්තේ නම් ඉතා දීර්ඝ කාලයක් ස්වභාවික ව්‍යසනයන්ට ගොදුරු නොවී ගඩොල් ස්මාරක ආරක්‍ෂා කර ගැනීමේ හැකියාව ඇති වේ. නමුත් ස්තූපයේ ශක්තිය

මෙතෙක් සාහිත්‍ය ලේඛනයක ස්තූප ධාතුගර්භයක් පිළිබඳව සඳහන් කරන දීර්ඝතම විස්තරය සපයමින් රුවන්වැලි සෑයේ ධාතු ගර්භය පිළිබඳව මහාවංසයේ විස්තර කරයි (30:60-100).



ඡායාරූපය 01: රුවන්වැලි ස්තූපයේ ඉතිරිව තිබූ හස්ථි ප්‍රාකාරය පිළිබඳ පැරණි ඡායාරූපයක් (Ruwanweli Stupa 2016)



ඡායාරූපය 02: රුවන්වැලි ස්තූපයේ බටහිර බිත්තියේ ඉතිරිව ඇති හස්ථි ප්‍රාකාර කොටස්



ඡායාරූපය 03: රුවන්වැලි ආයකයක පැරණි ස්වරූපය (Lawton 1870s)




ඡායාරූපය 04: රුවන්වැලි ස්තූපයේ සංරක්ෂිත උතුරු ආයකයේ කල්පිත උපරිභාගය


අනතුරුව මහා පිරිසකගේ මැදිහත් වීමෙන් මහත් ගෞරව සහිතව ධාතු ගර්භයෙහි ධාතු නිධන් කරවා, එහි ගෝලාකාර බඳ ඉදි කිරීමේ කටයුතු අවසන් කොට සතරැස් කොටුව ද සමගින් ස්තූපයේ බොහෝ ප්‍රමාණයක වැඩ කටයුතු අවසන් කරයි (එම., 31:1-125). කොත ඉදි කිරීමත්, හුණු පිරියම් කිරීමත් තිබිය දී දුටුගැමුණු රජු මරණාසන්න වූයෙන් සොයුරු සද්ධාතිස්ස කුමරු ශ්වේත වර්ණ රෙදි ගෙන ඒවායින් චෛත්‍යය ආවරණය කොට අංග සම්පූර්ණ මහා ස්තූපය ලෙස පෙනෙන්නට සළස්වා තිබේ (එම., 32:1-6).

දුටුගැමුණු රජුගේ අභාවයෙන් අනතුරුව ක්‍රි.පූ. 137 දී මෙරට පාලකයා බවට පත් සද්ධාතිස්ස රජු රුවන්වැලි සෑයේ ඉතිරි ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කොට එය පූර්ණ වශයෙන් නිමවා, හුණු ද පිරියම් කර, හස්ති ප්‍රාකාරයක් ද බැඳ (එම. 33:5-6) එතෙක් ලංකාවේ විශාලතම ස්තූපය බවට පත් කරමින් රුවන් වැලි ස්තූපයේ ඉදිකිරීම් කරයුතු අවසන් කරයි. මෙම සද්ධාතිස්ස රජුගේ කාර්යය පිළිබඳව අදහස් දක්වන පරණවිතාන මහතා පෙන්වා දෙන්නේ රජු විසින් ස්තූපයේ කොත් කැරැල්ල ඉදිකරන ලද බවකි (කුලතුංග, 2001, 32).


පිළිබඳ මූලධර්ම ස්ථානයෙන් ස්ථානයට වෙනස් අයුරින් බලපායි. ඒ අනුව ස්ථානීයව වෙනස් ගුණ සහිත ගඩොල් භාවිත කිරීමට ද සිදු වන අවස්තා පවතී.




ඡායාරූපය 05: රුවන්වැලි ස්තූපයේ සංරක්ෂිත බටහිර ආයකය වර්තමානයේ




සිතියම 02: රුවන්වැලි ස්තූපය හා එහි පරිවාර ස්තූප ගුවනින් (Google Maps (2016)



ඡායාරූපය 06: රුවන්වැලි ස්තූපය හා එහි පරිවාර ස්තූප (Wikipedia (2016)



ඡායාරූපය 07: රුවන්වැලි ස්තූපයේ ගිණිකොණ දිගින් වූ පරිවාර ස්තූපය (Google Maps 2016)



සැලසුම 01: රුවන්වැලි ස්තූපයේ සෙල් මලුවේ දකුණු දිශාවෙහි පවත්නා කුඩා ස්තූපය (Smither, 1894, plate XXXIV)

අවසන් ප්‍රතිසංස්කරණයෙන් අනතුරුව මෙම ස්තූපයේ උස ප්‍රමාණය මීටර් 101.40ක් පමණ වේ (හෙට්ටිආරච්චි, 2009, 23). සෙල් ඇතිරූ මළුව සමාන දිග පළලකින් යුතු අතර, එය මීටර් 143කි. සලපතළ මළුවට ඔබ්බෙන් ඇති සීමා ප්‍රාකාරයේ ඉදිරි මුහුණතෙහි මීටර් 2.70ක් පමණ උසැති ඇත් රූප 334කි. ඒවා අතරින් පැරණිම ඇත් රූප පන්තියේ ස්වභාවය හඳුනා ගැනීම සඳහා ආරක්ෂා කොට ඇති ඇත් රූප කිහිපයක් බටහිර දොරටුව සමීපයෙහි වෙයි (ඡායාරූප 01-02). හත්ථිප්‍රාකාරයෙන් පිටතට විහිදී ගිය වැලි මළුව මීටර් 30කට ආසන්න පළලකින් යුතු වේ (වගුව 01). සිව් දිශාභිමුඛව වැලි මළුව සමාන දිග ප්‍රමාණයක් නියෝජනය කරන අතර, එය මීටර් 205කි. ස්තූපයට බද්ධව සලපතළ මළුව මත ප්‍රවේශ ද්වාරයන්ට මුහුණලා පිහිටි 'වාහල්කඩ'[11] හෙවත් 'ආයක' (එම., 23) අතරින් තුනක් ම උපරිභාගය පිළිබඳ කල්පිත අදහසින් ප්‍රතිසංස්කරණයට භාජනය කර තිබේ (ඡායාරූපය 03-04). දැනට බටහිර දිගින් වූ ආයකය පමණක් පැරණි ස්වරූපයෙන් ම ආරක්ෂා කර ඇත (ඡායාරූපය 05). ප්‍රධාන දාගැබ පිරිවර කොට සලපතළ මළුවෙහි මුළු සතර නියෝජනය වන ලෙස නිර්මාණය කර ඇති පරිවාර දාගැබ් සතරින් (ඡායාරූප 06-07; සිතියම 01) ගිණිකොණ දිග හා නිරිත දිග කුඩා දාගැබ් ජේ.ජී. ස්මිදර්ගේ (Smither, 1993, pl.xxiii) පැරණි සැළසුම්වල පැවතී ඇති හෙයින් සෙසු මුළු නියෝජනය වන ලෙස ද දාගැබ් පැවතිය හැකි බව පරණවිතාන මහතා විසින් 1963 දී විස්තර කර තිබේ (පරණවිතාන, 2005, 59). 1960 දශකයේ අවසන් සමය වන විට මේවායින් සියල්ල ප්‍රතිසංස්කරණය කර තිබේ (හෙට්ටිආරච්චි 2009:25).

නැගෙනහිර දොරටුවට වම් පසින් සලපතළ මළුවේ පිහිටා ඇති විහාර මන්දිරය තුළ පවත්නා බුදු පිළිම හතරක් අයත් කාලය පිළිබඳව ආනන්ද කුමාරස්වාමි මහතා අනුගමනය කරමින් පරණවිතාන මහතා පෙන්වා දෙන්නේ ක්‍රි.ව. දෙවන ශතවර්ෂයට මෙය අයත් බවයි (2005, 59).

---

11 .......... විශාල දාගැබ් අතුරෙන් බොහොමයක ම සතර සිග්භාගයන්හි දොරටුවලට මුහුණ ලා ඇති අනුලම්බ හෙවත් ප්‍රකෂේපණ නූතන සිංහලයේ "වාහල්කඩ" නමින් හඳුන්වනු ලැබේ (පරණවිතාන, 2005, 38).

මෙම විහාර ගෘහය අබියස පැරණි ශිලාමය කාන්තා රුවක්[12], භාතිය රජුගේ යයි වැරදි ලෙස හඳුනා ගත් කණිට්ඨතිස්ස රජුගේ ප්‍රතිමාවක්[13] ද හඳුනා ගත හැකිය (හෙට්ටිආරච්චි, 2009, 24). නැගෙනහිර ප්‍රවේශයෙන් දකුණු පසට වන්නට ඇති දුටුගැමුණු රජුගේ යයි සැළකෙන ප්‍රතිමාව[14] මීටර් 2.85ක් තරම් උසය. මෙය හමු වී ඇත්තේ සලපතළ මළුවේ ස්තූපයට ආසන්නයෙහි. දාගැබේ නිරිත දෙසින් මීටර් 1.60ක පමණ උසකින් යුතු කුඩා ප්‍රමාණයේ ස්තූපයක් (සැලසුම 01) දැක ගත හැකි අතර, මෙය අනුරාධපුර අවසන් භාගයට හෝ පොළොන්නරු අවධියට අයත් විය හැකි බව පරණවිතාන මහතා පෙන්වා දෙයි (2005, 59).

වර්තමානයේ අනුරාධපුරයේ පවත්නා මහා ස්තූප අතරින් අංගසම්පූර්ණ ලෙස සංරක්ෂණයට භාජනය වූ ස්තූපය රුවන්වැලි සෑයයි. මෙහි විශ්වීය ස්ථානගත වීම උතුරු අක්ෂාංශ $08^{0}21'49''$ හා නැගෙනහිර දේශාංශ $80^{0}23'49''$ යන ඛණ්ඩාංක ඔස්සේ පෙන්වුම් කරයි (සිතියම 01-02). වන්දනා බැතිමතුන්ගේ නිබඳ ගෞරවයට පාත්‍රව ඇති මෙහි වර්තමානයේ ආගමික කටයුතු විහාරවාසී භික්ෂූන්වහන්සේගේ මැදිහත් වීමෙන් සිදු වන අතර, පුරාවිද්‍යාත්මක කටයුතු සිදු වන්නේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව හා මධ්‍යම සංස්කෘතික අරමුදල මගිනි.

**අභයගිරි දාගැබ්කරණය**

මාතෘකානුගත සන්දර්භයෙහි වැදගත් වන්නා වූ තෙවන මහා දාගැබ වූයේ අභයගිරි ස්තූපයයි. රුවන්වැලි සෑය නිර්මාණය කිරීමේ උණුසුම පිටව යන්නත් මත්තෙන්, අඩ සියවසකටත් අඩු කාලයක දී නිර්මාණය කරනු ලැබූ අනෙක් දැවැන්ත ස්තූපය වූ මෙය නිර්මාණය කරන්නේ වළගම්බා රජ (ක්‍රි.පූ. 89-77) සමයේ දී ය[15] (මව., 33:85).

මහා බෝධියට, රුවන්වැලි ස්තූපයට, ථූපාරාමයට මෙන්ම අනුරාධපුර පැරණි නගරයට ද උතුරු දෙසින් පිහිටා ඇති අභයගිරි නම් වූ මහාවිහාර පරිශ්‍රයේ කේන්ද්‍රස්ථානය ලෙස සළකනුයේ අභයගිරි ස්තූපයයි. එය විශ්වීයව උතුරු අක්ෂාංශ $08^{0}22'13''$ හා නැගෙනහිර දේශාංශ $80^{0}23'43''$ යන ඛණ්ඩාංක යටතේ ස්ථානගත වී ඇත.

අභයගිරිය නිර්මාණය වීම අස්ථාවර දේශපාලන තත්ත්වයක් අවසන් කිරීමෙන් යුතුකම් ඉටු කිරීමේ අභිලාසයෙන් සිදු වූවක් බව වංසකතාව පෙන්වා දෙයි. ඒ අනුව නගරයට උතුරු දිගින් වූ ගිරි නිසණ්ඨාරාමය බිඳ දමා (දීව., 19:15; මව., 33:44-45,81), දොළොස් පිරිවෙන් ගොඩනගා (මව., 33:81), නිසණ්ඨයාගේ නාමයෙන් 'ගිරි' යන්නත් රජුගේ නාමයෙන් 'අභය' යන්නත් ගෙන 'අභයගිරි' යනුවෙන් වූ විහාරය කරවා (එම., 33:84-85) රජුට අතිශය දුෂ්කර අවස්ථාවේ දී බෙහෙවින් උපකාර කළ

12 මෙම රූපය විහාර මහා දේවියගේ යයි විශ්වාස කෙරේ (හෙට්ටිආරච්චි 2009:24).

13 මේවා පරණවිතාන මහතා විසින් පෙන්වා දෙන්නේ බෝධිසත්ත්ව ප්‍රතිමා ලෙසයි (2005:59).

14 පරණවිතාන මහතා විසින් පෙන්වා දෙන්නේ මෙය බෝසත් රුවක් විය හැකි බවයි (2005, 59). කඹුරුපිටියේ වනරතන හිමියන් විසින් ද පරණවිතාන අදහස පිළගනී (1970, 82). මෛත්‍රී බෝසතුන්ගේ ප්‍රතිමාවක් බව කේව් විසින් ද පෙන්වා දී ඇත (1956, 42). නමුත් නන්දදේව විජේසේකර මහතාගේ අදහස නම් මෙයින් සැදැහැති රජ කෙනෙකුන් නිරූපණය කරන බවයි (1970, 254).

15 මහාවංසයේ සඳහන් ආකාරයට අභයගිරි ස්තූපය ද වළගම්බා රජු විසින් ඉදි කරන ලද බව පරණවිතාන මහතා (2005, 6) ඇතුළු විද්වතුන් රැසක් පෙන්වා දුන්නත්, කඹුරුපිටියේ වනරතන (1970, 95-96) නාහිමියන් හා චන්ද්‍රා වික්‍රමගමගේ (2001, 67) පවසන්නේ මෙය පළමු ගජබා රජතුමාගේ (ක්‍රි.ව. 114-136) නිර්මාණයක් බවයි. සත්‍ය වශයෙන් ම වළගම්බා රජු අභයගිරි ස්තූපය කරවන ලද බව දීපවංසය, මහාවංසය, වංසත්ථප්පකාසිනිය, නිකාය සංග්‍රහය, පූජාවලිය ආදී කිසිදු මූලාශ්‍රයක සඳහන් නොකරයි (හෙට්ටිආරච්චි, 2009, 64). එතෙක් ඉතිහාසයේ ඉදි කරන ලද සියලු ස්තූප සම්බන්ධයෙන් යම් හෝ අදහසක් සැපයූ මූලාශ්‍ර අභයගිරි සෑය නම් වූ එතෙක් විශාලතම ස්තූපය ඉදිකිරීම සම්බන්ධයෙන් නිහඬ වීම ගැටළුවකි. නමුත් දීපවංසයේ


" **තිස්සසත්‍රජො පුත්තො ගජබාහුන ගාමිණි**
**කාරාපෙසි මහාථූපං භයාරාමෙ මනොරමෙ** " (දීව., 22:13)

(**තිස්ස රජුගේ අතිජාත පුත්‍ර වූ ගජබාහු ගාමිණී රජු මනෝරම්‍ය වූ අභයගිරි විහාරයෙහි මහා සෑයක් ද කරවීය**) යනුවෙන් වූ සඳහනට අනුව ගජබා රජු විසින් කවර ලෙසකින් හෝ අභයගිරි විහාරයෙහි මහ සෑයක් ගොඩනගා තිබේ. හෙට්ටිආරච්චි මහතා විසින් මෙන්ම වික්‍රමගමගේ මහතා විසින් ද මේ මතභේදාත්මක තත්ත්වය පිළිබඳව සාහිත්‍යමය හා පුරාවිද්‍යාත්මක තොරතුරු ඔස්සේ විශ්ලේෂණාත්මක විග්‍රහයක් කොට විස්තරාත්මක ලේඛනයන් සපයයි (හෙට්ටිආරච්චි, 2009, 63-70; වික්‍රමගමගේ, 1986, 11-14).

කුපික්කල මහාතිස්ස හිමයන්ට පෞද්ගලික පූජාවක් ලෙස ප්‍රදානය කළ බව[16] පැවසේ (එම., 33:83). අභයගිරි ස්තූපයේ පිටත සීමා ප්‍රාකාරය දිගින් මීටර් 238ක් හා සම සතරැස් වූවකි. මේ සඳහා ප්‍රවේශ වීමට සිව් දිශාභිමුඛව ප්‍රාකාරයේ හරි මැදින් පවත්නා ප්‍රවේශ මණ්ඩප (ගෝපුර) සතරකි. වර්තමානයේ දී ඒවා සියල්ලක් ප්‍රතිසංස්කරණය කර තිබේ. පඩිපෙළක් ඔස්සේ ගෝපුරයට නැගීමෙන් අනතුරුව එහි මණ්ඩපය දිගේ ගමන් කිරීමෙන් තවත් පඩිපෙළකින් බසින්නේ වැලි මළුවටයි. වැලි මළුව මීටර් 27ක පළලින් යුතු වේ. සිව් දිශාවෙන් සලපතළ මළුවට ප්‍රවේශ වීම සඳහා පියගැටපෙළක් තරණය කළ යුතුය. එම පියගැටපෙළ පාමුළ මීටර් 8ක පමණ පළලින් යුතු විශාල සඳකඩ පහණ සතරකි. කිසිඳු සැරසිල්ලක් හෝ කැටයමක් නොමැතිව ගල් තීරු එක් කිරීමෙන් මේවා නිර්මාණය කර තිබීම විශේෂත්වයකි (ඡායාරූපය 08). සෙල් ඇතිරූ මළුව වැලි මළුවට වඩා මීටර් 1.9ක් උසින් පිහිටයි.



ඡායාරූපය 08: අභයගිරි ස්තූප (උතුරු) සෙල් මලුවෙන් වැලි මලුවට ප්‍රවේශවන පියගැටපෙළ අවසානයේ සෙල් තීරුවලින් කළ සඳකඩ පහන



ඡායාරූපය 09: අභයගිරි ස්තූපය (1893 දී) කොත් කැරැල්ලේ ඉහළ කෙළවර කැඩී ගොස් ඇති අයුරු

16 කුපික්කල මහාතිස්ස හිමියන් පෞද්ගලිකව මේ විහාරය පිළිගැනීමත් සමග එතෙක් ථේරවාදී නිකායේ ආරාම පොදු වශයෙන් පිළිගැනීමේ සම්ප්‍රදාය බණ්ඩනය වෙයි. එයින් හට ගත් අර්බුදය හේතුවෙන් කුපික්කල මහාතිස්ස හිමියන් 'කුලසංසර්ග' දෝෂයට ලක්ව මහාවිහාරයෙන් නෙරපාලනු ලැබීය (මව., 33:97). එයින් පසුබට නොවූ තිස්ස හිමියන් ස්වකීය ශිෂ්‍යවර 'බහලමස්සු තිස්ස' (මව., 33:99) නම් ස්ථවිරයන් හා තවත් පන්සියයක් භික්ෂූන් ද සමග ථේරීය නිකායෙන් භින්නව අභයගිරියට ගිය බව නිකාය සංග්‍රහය පෙන්වා දෙයි (නිස., 1987:21). මේ තත්ත්වය තුළ අවුරුදු දෙසීයකට අධික කාල වකවානුවක් තුළ මෙරට පැවති ථේරවාදී සම්ප්‍රදාය පිළිබඳව ඇතැමුන්ගේ යම් නොසතුටක් පැවතියේ දැයි සැකයක් මතුවන බව මහාවංසයේ (33:90-92,101-103) හා නිකාය සංග්‍රහයේ (1987:21) අන්තර්ගතයන් පිළිබඳව අවධානයෙන් හෙට්ටිආරච්චි (2009, 64) මහතා පවසයි. කෙසේ නමුත් මේ තත්ත්වය හමුවේ ශ්‍රී ලංකාවේ බුදු සසුන මෙන්ම සිංහල සංස්කෘතිය ද නව මගකට යොමු වීමට තුඩු දුන් බව වඩාත් පැහැදිලි ය.

මෙම මළු දෙක වෙන් කිරීමේ සීමාවෙහි වූ පනා බැම්ම ඉතා චම්ව බොරදම් තීරු කිහිපයකින් යුතුව පමණක් ගඩොලින් නිර්මාණය කරන ලද්දකි. සලපතළ මළුවේ දිග හා පළල ද සමාන වන අතර එය මීටර් 180කට මදක් අඩුය (වගුව 01). ස්තූපයේ සිව් දිශාභිමුඛව පිහිටි ආයක සතර වර්තමානයේ දී ප්‍රතිසංස්කරණයට බඳුන් කර ඇත. කැණීම්වල දී උතුරු හා නැගෙනහිර ආයක අතර කලාපයේ තිබී යූපස්ථම්භයක (කරවිඩක ටැඹක) කැබලි කිහිපයක් ම අනාවරණය කරගෙන තිබේ (හෙට්ටිආරච්චි, 2009, 60-61). අභයගිරි ස්තූපයේ උස ප්‍රමාණය නිශ්චිත නොවන්නේ කොත් කැරැල්ලෙන් කොටසක් කැඩී ගොස් ඇති බැවිනි. නමුත් මේ පිළිබඳව ඉතා සර්ථක අධ්‍යයනයක් සිදු කරන චන්ද්‍රා වික්‍රමගමගේ මහතා විසින් දක්වන්නේ අභයගිරි ස්තූපයේ මුළු උස රියන් 140 = අඩි 280ක් වන බවයි[17]. ස්තූපයේ කොත් කැරැල්ලෙන් අඩි 34ක ප්‍රමාණයක්[18] කඩී ගොස් ඇති බැවින් දැනට හඳුනා ගත හැක්කේ ස්තූපයේ අඩි 246ක[19] උස ප්‍රමාණයක් (ඡායාරූපය 09) පමණි (වික්‍රමගමගේ, 1986, 17).

දකුණු ආයකයට ඉදිරිපසින් පිහිටි විහාර ගෘහය 1918 දී ඉදි කරන ලද්දකි. වර්ෂ 1910 වන විටත් මෙම ස්තූපය කුමක් ද යන්න නිවැරදිව හඳුනාගෙන නොතිබුනි. ස්මිදර් විසින් අනුරාධපුරය සම්බන්ධයෙන් ඉදිරිපත් කරන කෘතියේ මෙම ස්තූපය හා ජේතවන ස්තූපය නාමිකව මාරු කරමින් භාවිත කර තිබේ. එච්.සී.පී. බෙල් මහතා විසින් අභයගිරි ස්තූපයේ දකුණු වාහල්කඩ අසළින් සොයා ගන්නා ලද සෙල් ලිපියක (EZ., Vol. I, 1912, 154) මෙහි නිවැරදි නාමය අභයගිරිය බව හඳුනා ගන්නා නමුත් වැරදි නිවැරදි කිරීමක් සඳහා යොමු වූ බවක් හඳුනා ගත නොහැක. මේ පටලැවිල්ල නිරාකරණය කරන්නේ සෙනරත් පරණවිතානයන් විසිනි (වික්‍රමගමගේ, 1986, 11). වනයෙන් වැසී ගිය අභයගිරි ස්තූපයේ බොහෝ කොටස් අනාවරණය කර ගැනීම 1980න් පසු සිදු වේ. කෙසේ නමුදු වර්තමානය වන විට ස්තූපය පෙරටුකොට ගත් බොහෝ ප්‍රමාණයක ස්මාරක ශේෂයන් හි සංරක්ෂණ කටයුතු හා ඉදිරිපත් කිරීම් සිදු කර තිබේ.

## ජේතවන දාගැබ්කරණය

මහසෙන් රජු විසින් (ක්‍රි.ව. 276-301) මහා ස්තූප තැනීමේ තෙවැනියා බවට පත් වෙමින් ඉතා දැවැන්ත නිර්මාණයක් ලෙස[20] ජේතවන[21] ස්තූපයත් විහාර සංකීර්ණයත් නිර්මාණය කරනු ලබයි (මව., 37:32-34). මෙරට භික්ෂු ශාසනය තුළත් දේශපාලනය තුළත් සංකීර්ණ ගැටළු පැන නැගී ඇති සමයෙක ය. රජතුමා දක්ඛිණගිරි විහාරයේ වාසය කළ 'කොහොන් තිස්ස'[22] නම් තෙර කෙනෙකුන්

---

17 මෙය මීටර්වලින් ගණනය කිරීමේ දී ලැබෙන්නේ මීටර් 84ක් වශයෙනි (වගුව 01).

18 මෙය මීටර්වලින් නම් 10කුත් සෙන්ටිමීටර් 20කි.

19 මීටර් 73.80ක ප්‍රමාණයකි (වගුව 01).

20 ආරම්භයේ දී මෙම ස්තූපය ප්‍රමාණාත්මකව කුඩාවට නිර්මාණය කළ බව ඇම්.එච්. සිරිසෝම හා සද්ධ මංගල කරුණාරත්න යන අයගේ අදහස බව පියතිස්ස සේනානායක පෙන්වා දෙයි (2015, 13). නමුත් පරණවිතාන මහතා පෙන්වා දෙන්නේ රියන් 160ක් උසට මහසෙන් රජු විසින් ම මෙය නිර්මාණය කරන ලද බවයි (2005/1963, 7).

21 මෙම ස්තූපය ඉදි කරන ලද ස්ථානය අතීතයේ බුද්ධ ශාසනය බැබලවීම සඳහා මුල් වූ ස්ථානය වූ හෙයින් 'ජෝති වනය' යනුවෙන් හඳුන්වාජේතවනය බවට එය බැවහර වූ බව ඓතිහාසික මූලාශ්‍රයන්හි සඳහන් වේ (දීව., xiv:45; සම.පා., 66; වංස.ප., 1994, 281-282). 'දෙනා වෙහෙර්', 'දෙනා රජමහ වෙහෙර්' (EZ., I, 1912, 218; EZ., II, 1985, 46; EZ., III, 1989, 132; EZ., III, 1989, 227), 'දෙනාවෙහෙර' 'දේනාවෙහෙර' 'දෙනානක ථූපය' 'දෙනානකය' 'දෙනානක නම් සෑය' 'ජේතවන මහ වෙහෙර' 'දෙනා රජ් මහවෙහෙර්' 'ජෙවන විහෙර' (දීව., xiv, 45; සම.පා.,66; වංස.ප. 1994, 281-282; පූව., 1986, 781: පැරකුම්බා සිරිත, 1997, 27; රාජරත්නාකරය, 1995, 86; කුලතුංග, 2004(අ); සේනානායක, 2015, 11) යනා දී නම් බොහොමයක් ම මේ විහාර සංකීර්ණය හැඳින්වීම සඳහා භාවිතයෙහි යෙදී ඇත. 'දෙව්නා මහ වෙහෙර' 'දෙනානක' (වත්තල, 1994, 21), 'ජෙවන වෙහෙර' (හෙට්ටිආරච්චි, 2009, 113) යනා දී නාමයන් ද ඒ අතර වේ.

22 මහාවංසය හා නිකාය සංග්‍රහය යන මූලාශ්‍රද්වයෙහිම මෙම භික්ෂුව පැහැදීමකට ලක් නොවූ පාපී අයෙක් ලෙස හැඳින්වීමට උත්සාහ දරා තිබේ. '....... දකුණු අරම් වැසි කුහක වූ වංක සිත් ඇති පාප මිත්‍ර වූ නොසන්හුන් තිස්ස තෙරුන් ..........'(මව., 37:32-33) යනුවෙන් ද '........ දකුණුගිරි වෙහෙර වසන වංක සිත් ඇති කොහොන් තිස්ස නම් තෙරුන් .........'(නිස., 1987:25) යනුවෙන් ද වූ ප්‍රකාශයන් තුළින් ඒ බැව් මනාව ප්‍රත්‍යක්ෂ වේ. හැරත් මෙය පෞද්ගලික අපැහැදීමක් ලෙස ගැනීමට වඩා දක්ඛිණගිරි විහාර වාසික භික්ෂූන් කෙරෙහි මහාවිහාරික භික්ෂූන්ගේ පැවති නොකැමැත්තක් ලෙස ගැනීම වඩාත් ගෝචර වේ (හෙට්ටිආරච්චි, 2009, 112). මෙම අදහස වඩාත් තහවුරු වන්නේ හතර වන මිහිඳු රජුගේ ජේතවන පුවරු ලිපියක තිස්ස තෙරුන් උසස් ගතිගුණ ඇති භික්ෂුවක් ලෙස මෙසේ පෙන්වා දීමෙනි '....... සාගුලි මහ හිමියන් නැමින් පාළ වූ අපිස් සතොස් තිස් මහ තෙරනට් පිහිටි දෙනා රජමහ වෙහෙර්හි ........'(EZ., III, 1933, 227) එනම් .... සාගුලි මහ තෙරුන් වහන්සේගේ නාමයෙන් පහළ වූ ලද දෙයින් සතුටු වන්නා

කෙරෙහි පැහැදී මහාවිහාර සීමාව තුළ ම නැගෙනහිර දෙසින් පැවති ජෝතිවන ප්‍රදේශය පාදක කර ගනිමින් මේ විහාර කර්මාන්තය කරයි (මව., 37:32-33; නිස., 1987, 25; වංසත්ථප්පකාසිනී, 1997, 552). දක්ඛිණගිරි විහාරයෙන් පැමිණි භික්ෂූන්ගෙන් මෙම විහාරය ප්‍රභවය වූයෙන් එහි භික්ෂූන් හැඳින්වූයේ සාගලික නිබාය හෙවත් දෙනානක (ජේතවන) නිකායික භික්ෂූන් ලෙස යි.

ශරත් වත්තලට අනුව මහසෙන් රජු විසින් අනුබුදු මිහිඳු හිමියන් ආදාහනය කළ පූජනීය ස්ථානය සිහි කරනු වස් නන්දන උයනේ ජේතවන විහාරයත් ස්තූපයත් ඉදි කරවා තිබේ (වත්තල, 1994, 22). ඊට අනුව  ජේතවන විහාරය කරවා ඇත්තේ මහාවිහාර සීමාව තුළමය. නමුත් මෑතක දී ජේතවන බටහිර සීමාවේ වූ හාල්පානු ඇළට සම්බන්ධ කාණුවක බිත්තියකට සම්බන්ධ කොට තිබී ඉතා කෙටි ශිලා ලිපියක් සොයාගෙන ඇත. එහි සඳහන් ව ඇත්තේ '**ජෙවන වෙහෙර සිමෙ**' යනුවෙනි. නිශ්චිතවම මෙය ජේතවන විහාර සීමාව ලෙස හඳුනා ගත හැකි බවත් අක්ෂර ලක්ෂණ අනුව ක්‍රි.ව. 3-4 කාලයට අයත් වන බවත්, ඒ අනුව මෙය මහසෙන් සමයේ දී ම අර්බුද[23] සමනය කිරීමේ පරමාර්ථයෙන් මෙය යොදන්නට ඇති බවත් හෙට්ටිආරච්චි මහතා පෙන්වා දෙයි (2009, 113). මහාවංසය ජේතවන විහාරය, මහාවිහාරයේ භූමියේ ම ඉදි කරන ලද බවට පෙන්වා දුන්නත් ආරාමය ඉදි කිරීමෙන් අනතුරුව අනාගත අර්බුද සමනය කරනු වස් මෙසේ විහාර සීමාව මහසෙන් රජු විසින් ම වෙන් කර තබන්නට අතැයි කල්පනා කිරීම සහේතුක ය. මහාවංසය ජේතවන ස්තූපයේ ධාතු පිහිටුවීම[24] සම්බන්ධයෙන් නිහඬ ප්‍රතිපත්තියක් අනුගමනය කරයි. බොහෝ දුරට මෙසේ සිදු වන්නට ඇත්තේ ද පෙර සඳහන් අන්තර් ආරාමික ගැටුම නිසා විය යුතුය. කෙසේ නමුත් මහසෙන් රජුගේ ඇවෑමෙන් රජ පවට පත් ඔහු පුත් කිත්සිරිමෙවන් රජු (ක්‍රි.ව. 303-331) විසින් පිය රජු ඉදි කිරීමට ආරම්භ කරන ලද ජේතවන ස්තූපයේ ඉදිකිරීම් කටයුතු අවසන් කළ බව මහාවංසය පෙන්වා දෙයි (මව., 37:51-65).

වර්තමානයේ දී අටමස්ථානාධිපතීන් වහන්සේගේ භාරකාරත්වය යටතේ ආගමික කටයුතු සිදු වන ජේතවන ස්තූපය ප්‍රමුඛ කොට ගත් ස්මාරක පරිශ්‍රය සම්බන්ධයෙන් පුරාවිද්‍යා කටයුතු සිදු කරන්නේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙහි අවසරය පරිදි මධ්‍යම සංස්කෘතික අරමුදල මගිනි. ස්තූපය උතුරු අක්ෂාංශ $08^{0}21'02''$ හා නැගෙනහිර දේශාංශ $80^{0}24'12''$ ඛණ්ඩාංක යටතේ විශ්වීය ස්ථානගත වීම පෙන්වුම් කරයි. ස්තූපය ප්‍රමුඛ කොට ගත් සමස්ත ආරාම පරිශ්‍රයේ භූ වපසරිය අක්කර 195ක් බවත් එය නැගෙනහිරින් මල්වතු ඔයත්, බටහිරින් හාල්පානු ඇළත් සීමා කොටගෙන පැතිරී ඇති බවත් රත්නායක මහතා පෙන්වා දෙයි (1984:3).

---

වූ (අල්පේච්ඡතා සංතුට්ඨිතා ගුණ ඇත්තා වූ) තිස්ස මහ තෙරුන් වහන්සේ වෙනුවෙන් පිහිටුවන ලද ........ යන ප්‍රකාශයයි. මෙයින් මූලාශ්‍ර වර්ග දෙකෙහි දෙආකාරයකින් මෙම කරුණ ඉදිරිපත් කරන බැවින් ජේතවනාරාමය පිළිගත් භික්ෂුව දැඩි අපහසුවකට පත් වූ බව නාම් වඩාත් පැහැදිලි බව පරණවිතාන මහතා පෙන්වා දෙයි (EZ., III, 1933, 228). අවසානයේ දී මෙම තිස්ස හිමියන්ට මහාවිහාරීය භික්ෂූණ් විසින් 'අන්තිම වස්තුවෙන්' කළ චෝදනාව විමර්ශනය කළ ධාර්මික නම් අමාත්‍යවරයා රජුගේ නොකැමැත්ත පිටම තිස්ස හිමියන් ව සිවුරු හැරවීමට නිර්දේශ කරයි (මව., 37:38-39; නිස., 1987, 26).

23 මහා විහාර සීමාව තුළ ජේතවන විහාරය කරවීමට උත්සාහ කිරීමේ දී මහාවිහාරීය භික්ෂූන් ඊට දැඩි ලෙස විරෝධ වූහ. මෙහි දී අභයගිරි වාසික භික්ෂූන්ගේ සහයෝගය ලැබී ඇත්තෙ ද ජේතවන විහාර පාර්ශ්වයටයි. රජු විසින් මහාවිහාර සීමාව වෙනස් කර දෙන ලෙස ඉල්ලා සිටි මොහොතේ ඊට එකඟ නොවූ මහා විහාරීය භික්ෂූන් විහාරය අතහැර රෝහණයට පලා ගොස් ඇත. එසේ නොගිය සුළුතර භික්ෂූන් වහන්සේලා පිරිසක් ජේතවන විහාර සීමාව සළකුණු කළ පසු රහසිගතව සැඟවී සිටිමින් ඒවා ගලවා දැමූහ (මව., 37:37).

24 මහසෙන් රජු ජේතවන ස්තූපය කරවා එහි නිධන් කිරීමට ධාතු නොමැතිව සිටිය දී දෙවියන් විසින් බුදුන් වහන්සේගේ පටී ධාතුව අහසේ සිට පහතට එල්ලෙන්නට සළස්වා ඇතත් රජු අත පැවත් ගත නොහැකි ලෙස ඉහළට පහළට කර ඇත. මෙයින් වෙහෙසට පත් රජු අහසට පැන තම කඩුවෙන් පටී ධාතුවෙන් කොටසක් කපා ගත් බව පැවසේ (පූව., 1997, 777). 15වන සියවසේ රචිත පැරකුම්බා සිරිතට අනුව 'ධාතු නොලැබුන හොත් ජේතවන මළුවේ සිට රා බොමි' යි රජු දෙවියන්ට ගර්ජනය කළ බව ද පැවසේ (පැරකුම්බා සිරිත, 1997, 17-18 කවි).

| ස්තූපය | පිටත සීමා ප්‍රාකාරයේ දිග හා පළල (මීටර්) | වැලි මළුවේ පළල (මීටර්) | වැලි මළුව හා සලපතල මළුව අතර උස අන්තරය (මීටර්) | සලපතල මළුවේ දිග හා පළල (මීටර්) | ස්තූපයේ පවත්නා උස (මීටර්) | ස්තූපයේ සත්‍ය උස (මීටර්) |
|---|---|---|---|---|---|---|
| මිරිසවැටිය | | 17 | | 84 x 84 | 57.60 | |
| රුවන්වැලිය | 205 | 29.90 | 2.50 | 143 | 101.40 | |
| අභයගිරිය | 238 | 27 | 1.90 | 179.10 | 73.80*[1] | 84*[2] |
| ජේතවනය | 209.90 | | | | 232 | |

වගුව 01: අනුරාධපුර මහා ස්තූපයන් හි මිනුම් කිහිපයක්




ඡායාරූපය 10: ජේතවන ස්තූපයේ පිටත බැම්ම හා ඇතුළත පනා බැම්ම

ස්තූපය ඉදිකිරීමේ ආකෘතිය අනුරාධපුරයේ සෙසු රුවන්වැලි හා අභයගිරි වැනි ස්තූපයන්හි ආකෘතියට බෙහෙවින් සමාන වේ. සිව් දිශාවෙන් ප්‍රවේශ වීම සඳහා මණ්ඩප සතරකි. එම මණ්ඩපයන්ට සම්බන්ධ වන පිටත සීමා ප්‍රාකාරය අක්‍රමවත් ගල් කැබලි සිරස්ව තබා බඳින ලද සමාන දිග පළලින් යුතු (වගුව 01) පවුරකි (ඡායාරූපය 10). වැලි මළුවත් සලපතළ මළුවත් අතර පියගැටපෙළ පාමුළ අභයගිරියේ සේම එකතු කරන ලද ගල් පුවරුවලින් සකසන ලද විශාල සඳකඩපහණකි. නමුත් පසින් වැසී ගොස් ඇති හෙයින් මේවා වර්තමානයේ දැක ගත නොහැක.

වැලි මළුවේ සිට මීටර් 2.15ක් උසින් ගඩොලින් බඳින ලද පනා බැම්ම (ඡායාරූපය 10) සලපතළ මළුවට ආධාරක සපයයි (හෙට්ටිආරච්චි, 2009, 109-110). සිව් දිශාභිමුඛ ආයක[25] සතර සංරක්ෂණය කර ඉදිරිපත් කර තිබේ. බටහිර ආයකය අභිමුව නව විහාර මන්දිරය ඉදිකර ඇත. ජේතවනාරාමයේ ස්තූපයට බටහිර දෙසින් තිබී අති විශාල පිළිම ගෙය ඉලක්ක කර ගනිමින් මේ නව විහාර මන්දිරය ස්ථාපිත කොට ඇතැයි සිතිය හැකිය.

### අතීත අනුරාධපුරයේ මහා ස්තූප කෙරෙහි මැදිහත්වීම් පිළිබඳ මූලාශ්‍රමය සාධක

අනුරාධපුරයේ මහා ස්තූප ඉදිකිරීම අහඹු සිදුවීමක් නොවීය. සැබැවින්ම ඒවා ශ්‍රී ලාංකේය ඉතිහාසයේ විවිධ සංස්කෘතික පරිවර්තනයන්හි පිළිබිඹුවන් විය. මෙම දැවැන්ත නිර්මාණ ඉතා දීර්ඝ කාලයක් පුරාවට පවත්වා ගැනීම ද පසුකාලීන පාලකයන්ට මහත් අභියෝගයක් වූවා නොඅනුමානය. තවද ඒවා රජවරුන් විසින් ස්වකීය බලයෙන්, ධනයෙන් හෝ දේශපාලනික ශක්තිමත් භාවයෙන් පවත්වා ගැනීම සිදුකළ හැක්කක් නොවේ. මේ ස්මාරකයන්හි අඛණ්ඩතාව සඳහා සැදැහැතියන්ගේ මානසික ශක්තිය ඇති කිරීම වෙනුවෙන් ද පාලකයන් හා බෞද්ධ ශාස්තෘවරුන් බෙහෙවින් කැප වූහ. රජු බෞද්ධයෙකු විය යුතුය යන ඒකමතික තීරණය ද, මෙය බෞද්ධ රාජ්‍යයක්ය යන ආගමික වාත්සල්‍යයෙන් යුතු ප්‍රකාශයන් ද, රජුන් ශාසනය වෙනුවෙන් ස්වකීය රාජ්‍යත්වය පවා පූජා කළේය යන ඓතිහාසික සිදුවීම් ද මෙවන් දැවැන්ත ස්තූප වැනි නිර්මාණ දීර්ඝ කාලයක් මහජන අවධානයෙන් යුතුව පවත්වා ගැනීමේ දී වක්‍රාකාරයෙන් යහපත් ලෙස බලපා තිබේ. මෙසේ ඉදිකිරීමෙන් අනතුරුව අනුරාධපුරයේ මහා ස්තූපවල දීර්ඝ කාලීන පැවැත්ම සම්බන්ධයෙන් සිදු කරන ලද විවිධ මැදිහත්වීම් පිළිබඳව ප්‍රථම, ද්විතීයික හා තෘතීයික මූලාශ්‍රයන් හි තොරතුරු දක්වා තිබේ. මෙම මැදිහත්වීම් හි ශේෂයන් පුරාවිද්‍යාත්මක පර්යේෂණ හමුවේ අනාවරණය කර ගැනීමට ද හැකි වී ඇත. විශේෂයෙන් අනුරාධපුර අවධියේ ද, ඉන් අනතුරුව සමයන්හි දී ද මෙරට දේශපාලන අධිකාරීත්වය දැරූ විවිධ දේශීය විදේශීය පාලකයන්ගේ මැදිහත්වීම හේතුවෙන් යුරෝපා ජාතීන්ගේ ආගමනයට පෙර කාලසීමාව තුළ අනුරාධපුරයේ මහා ස්තූපවල විනාශය අවම කිරීම සඳහා ගන්නා ලද පාලක අවධානයන් සම්බන්ධයෙන් මෙම ශීර්ෂයේ දී සාකච්ඡාවට බඳුන් වේ.

### මිරිසවැටි ස්තූපය සඳහා විවිධ මැදිහත්වීම්

දුටුගැමුණු රජුගෙන් අනතුරුව මූලාශ්‍රයන් හි මිරිසවැටි ස්තූපය සම්බන්ධයෙන් සඳහන් කරන්නේ වසර 200ක් ගිය තැන ගජබා රාජ්‍ය (ක්‍රි.ව. 112-134) සමයේ දී ය. ඒ ස්තූපය සම්බන්ධයෙන් 'කංචුකයක්'[26] නිර්මාණය කළ බව සඳහන් කිරීමේ දී ය (මව., 35:120). ඒ හැරෙන්නට වෝහාරිකතිස්ස රජ (ක්‍රි.ව. 214-236) දවස දාගැබේ ඡත්‍ර කරවා ඇත (එම., 36:35). මොහුගෙන් අනතුරුව මිරිසවැටි ස්තූපය සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කරන්නේ ක්‍රි.ව. 914-923 කාලයේ රජ කළ පස්වන කාශ්‍යප රජු විසිනි. හෙතෙම දාගැබ ඇතුළු වෙනත් ආරාමික ගොඩනැගිලි බොහොමයක ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කරවන ලද බව වංසකතාව පෙන්වා දෙයි (එම., 52:46-49). මින් අනතුරුව මිරිසවැටිය දාගැබ සම්බන්ධයෙන් ඍජු අවධානයක් යොමු වන්නේ පළමු පරාක්‍රමබාහු රාජ්‍ය (ක්‍රි.ව. 1153-1186) අවධියෙහි ය (Smither, 1993, 25). වනාන්තරයෙන් හා වන සතුන්ගෙන් ගහණව පැවති ස්තූපය පාදා මනා කොට ගඩොලින් බඳවා සුණු පිරියම් කොට මළුව ද පිරිසිදු කළ බව මූලාශ්‍රයේ සඳහනි (මව.79:102-106). අනුරාධපුරයේ ප්‍රතිසංස්කරණ කටයුතු වෙනුවෙන් ලෝකේ අරක්මෙනාවන් පත් කරන නිශ්ශංකමල්ල රජු (ක්‍රි.ව. 1187-1196) ද මිරිසවැටිය හා තවත් විහාර කරවූ බව (EZ., II, 1986, 78) සඳහන් කරතත්, ඒ කුමන ආකාරයේ කරවීමක් දැයි පැහැදිලි නැත (හෙට්ටිආරච්චි 2009:18-19). කෙසේ නමුත් පොළොන්නරු අවධියෙන් අනතුරුව සාහිත්‍ය මූලාශ්‍රකරුවන්ගේ අවධානයෙන් තොර වූ මිරිසවැටි ස්තූපය සම්පූර්ණයෙන්ම පාහේ අභාවයට යන්නට ඇතැයි සිතිය හැකි ය.

---

25 මෑතක දී සිදු කළ පුරාවිද්‍යාත්මක පර්යේෂණවලින් අනාවරණය වී ඇත්තේ මෙම ආයක ස්තූපයට පසුව එකතු කරන ලද අංගයන් බවයි (සේනානායක, 2015, 14).

26 කංචුකය නම් වැස්මක් බව හෙට්ටිආරච්චි මහතා පෙන්වා දෙයි (2009, 17). තව ද මෙසේ ඉදිකරන ලද කංචුකයේ සාධක එහි ප්‍රතිසංස්කරණ කටයුතුවල දී පැහැදිලිවම හඳුනා ගත හැකිව තිබූ බව ගාමිණී විජේසූරිය පෙන්වා දෙයි (1993, 7). ගරා වැටුන රුවන්වැලි ස්තූපයේ කොටසක් මතින් අභ්‍යන්තරය නිරීක්ෂණය කළ හැකි වූ බවත් දාගැබට ඇතුළතින් කපරාරු නොකළ තවත් දාගැබක් පැවති බවත් පාකර් පෙන්වා දෙයි (පාකර් 2008, 343). කංචුකය නම් වැස්මක් ම බව සනාථ කිරීම සඳහා මේවා වඩාත් සාධාරණ නිදර්ශනයන් ය.

## රුවන්වැලි දාගැබ සඳහා විවිධ මැදිහත්වීම්

මෙම දාගැබ සම්බනධයෙන් මුල්ම මැදිහත්වීම සිදු කරන ලද බවට සාහිත්‍ය මූලාශ්‍රයෙහි සඳහන් වන්නේ සදධාතිස්ස රජුගේ නාමයයි. ඡත්‍ර නැංවීම, හුණු ආලේප කිරීම, ඇත් පවුර කරවීම (මව., 33:5-6) රජුගේ රුවන්වැලි ස්තූපය සම්බන්ධයෙන් වූ මැදිහත්වීම් ය. දීපවංසයට අනුව ඇත් පවුර බැඳීම, කඤ්චුකයක් හා කාරාපිණ්ඩයක්[27] කරවීම යන ඒවා සිදු තිබේ (දීව., 20:5). සද්ධාතිස්ස රජු ගේ සහෝදරයෙකු වූ ලජ්ජිතිස්ස රජු (ක්‍රි.පූ. 119-109) මහාථූපය සඳහා නව වාස්තුවිද්‍යාත්මක අංග එක් කරයි. එසේ එකතු කරන අංග අතර 'තිලඤ්ජනයක්' පිළිබඳව දීපවංසය කියයි (20:10). සිංහල පරිවර්තනයට අනුව මෙයින් කියැවෙන්නේ මල් ආසන තුනක් පිළිබඳව ය (හෙට්ටිආරච්චි, 2009, 37-38). වංසත්ථප්පකාසිනියට අනුව ද කරවා ඇත්තේ සෙල් මුවා ආසන තුනකි (වංසත්ථප්පකාසිනී, 1997, 33:22). නමුත් මෙහි සඳහන් 'පුප්ඵාදාන' යන වචනය ගුරු තන්හි තබා ගනිමින් සෙනරත් පරණවිතානයන් පෙන්වා දෙන්නේ මේවා පේසා වළලු බවයි (13-14). එපමණක් නොව මුලින් පැවති පේසා වළලු ගඩොලින් තිබූ බවත්, ලජ්ජිතිස්ස රජු (ක්‍රි.පූ. 119-109) විසින් ඒවා සුදු හුණු ගල්වලින්[28] ආවරණය කර ඇති බවත් සඳහන් කරයි (එම). මෙම මතය සනාථ කරන හෙට්ටිආරච්චි මහතා පෙන්වා දෙන්නේ පේසා වළලු මත තිබූ ශිලා තලයන් හි සෙල් ලිපි මගින් ක්‍රිස්තු පූර්ව සමයේ තොරතුරු කියැවෙන බව යි. මහවංසය පෙන්වා දෙන ආකාරයට බල්ලාටනාග රජු (ක්‍රි.පූ. 109-103) විසින් වැලි මළුවට පිටින් ඇති ප්‍රාකාරය[29] කරවා තිබේ (මව., 33:31). කෙසේ නමුත් මේ ප්‍රකාශයට අනුව වැලි මළුවක් පැවතියේ නම් තවත් මළුවක් පැවතිය යුතු ය[30]. වැලි මළුව මොහු විසින් කරවන ලද්දේ ද යන්න නිශ්චිත නොවන නමුත්, කලින් පැවති එය ක්‍රමාණුකූල ලෙස සකස් කිරීම හෝ ඔහු විසින් කරවන්නට ඇත (හෙට්ටිආරච්චි, 2009, 38).

භාතිකාභය රජු (වර්ෂය) විසින් මහාථූපයට වේදිකා දෙකක්[31] එක් කරන ලද බව පැවසේ. වංස්තථප්පකාසිනියේ මේ දෙක 'කුච්ඡවේදිය' හා 'මුද්ධවේදිය' (1994, 506) ලෙස පෙන්වා දෙන අතර, මේවායේ පිහිටීම සම්බන්ධයෙන් ඉන්දියානු සංචි ස්තූපයේ හා දැලිවල කොටවෙහෙරින් සොයා ගත් ධාතු කරඬුවක (ඡායාරූපය 11) ස්වභාවයන් ද සළකා වඩාත් විස්තරාත්මක කථනයක් පරණවිතාන මහතා විසින් සිදු කරයි (2005, 15:25). ඊට අනුව 'කුච්ඡවේදිය' ස්තූපයේ පහළ සිට තෙවන පේසාව මත පැවති බව (ඡායාරූපය 12) ද, 'මුද්ධවේදිය' හතරැස් කොටුව අවුරා කරන ලද්දක් බව ද පවසයි. මීට සමගාමීව පාපිළිකඩ නමින් ද වචනයක් මහාවංසය ඉදිරිපත් කරයි (34:41). පරණවිතානයන් මෙය අරුත් ගන්වන්නේ දැගැබ් පාමුළ වූ ගරාදිවැටක් ලෙස යි (2005, 57). භාතිකාභය රජුගේ වෙනත් කාර්යයන් අතර, දාගැබ මත ඡත්‍ර නැවීමත් (මව., 34:41-44), හුණු ආලේප කිරීමත් (එම., :46), අභය වැවේ ජලය යන්ත්‍රානුසාරයෙන් ගෙන්වා මහාථූපය නැහැවීමත් (එම., :45) වැදගත් ගණයේ ලා සැළකිය හැකි ය. මෙහි දී හුණු ආලේප කිරීමේ දී හුණු ගැල් සියයක් මුතු හා තල තෙල් සමග මිශ්‍ර කර ආලේප කළ බව කියයි.

---


27 පරණවිතානයන් පෙන්වා දෙන්නේ කරවිඩක යනුවෙන් වූ මෙය කොත්කැරැල්ල විය හැකි බවයි (IC., II, 1983, 50). නමුත් හෙට්ටිආරච්චි මහතාගේ අදහසට අනුව නම් මෙය යූපස්ථම්භය කි (2009, 37).

28 1945 දී දකුණු ආයක කැණීම් සිදු කිරීමේ දී මේ සාධක මුල් වරට අනාවරණය කරගෙන තිබේ (නිශාන්ති, 2001, 3).


29 ........ මනරම් රුවන් මල් නම් මහ සෑය හාත්පස වැලිමලු සීමායෙහි පවුරු ද කරවීය ........(මව., 33:31).

30 මෙය වර්තමාන සෙල් ඇතිරූ මළුව නමුත් ඒ සමයේ සෙල් හෝ ගඩොල් අතුරා එය තිබෙන්නට ඇතැයි හෙට්ටිආරච්චි මහතා පෙන්වා දෙයි. මෙම සාධකය තහවුරු කිරීමෙ දී අභයගිරි, ජේතවන මෙන්ම තිස්සමහාරාම දැගැබ් මළුවල සිදු කරන ලද කැණීම්වලින් දාගැබ් මළුවේ සෙල් ඇතිරුමට යටින් ගඩොල් ඇතිරුමක සාධක අනාවරණය වීම යන සාධකය උපයෝගී කර ගනී (හෙට්ටිආරච්චි, 2009, 38). ඒ හැරෙන්නට සෝමාවතී දාගැබ් මළුවේ දැනුදු මේ ගඩොල් ඇතිරුම දැක ගත හැකිය.

31 ......... මහ සෑයෙහි පිළිකඩ දෙක ද ....... (මව., 34:39).



ඡායාරූපය 11: දැලිවල කොටවෙහෙරෙන් හමු වූ ධාතු කරඬුව (Schroeder, 1990)



ඡායාරූපය 12: රුවන්වැලි සෑයෙන් හමු වූ ධාතු කරඬුව (Schroeder, 1990, 62)

මහාදාඨික මහානාග රාජ්‍ය (ක්‍රි.ව. 9-12) සමයේ දාගැබ් මළුවේ කිඤ්චික්ඛ පාසාණ[32] අතුරුවා, වැලි මළුව විශාල කරවා සීමා ප්‍රාකාරයක් ද බැන්ද වූ බව පවසයි (එම.34:70). ආමණ්ඩ ගාමිණී අබය (ක්‍රි.ව. 22-31) රජු විසින් මහා තූපයේ ඡත්‍ර මත ඡත්‍ර නැංවූ බව ද, 'පාදවේදිය' හා උද්ධවේදිය' නිර්මාණය කළ බව[33] ද පෙන්වා දෙයි (මව., 35:2). මෙසේ ඡත්‍ර පිට ඡත්‍ර නැංවීම මෙරට පැවති බව සනාථ කරන පුරාවිද්‍යාත්මක සාධක අතර, රුවන්වැලි සෑ සෙල් මළුවෙන් ලැබෙන සිරිපතුල් ගල් කැටයමක වූ ස්තූප සටහන් මෙන් ම අභයගිරි ස්තූපයෙන් හමු වූ ධාතු කරඬුවල හැඩයන් සාක්ෂ්‍ය සපයයි (හෙට්ටිආරච්චි, 2009, 43). පළවන සිරිනාග රජු (ක්‍රි.ව. 195-214) විසින් මෙම ස්තූපයේ ඡත්‍රය කරවා ඇත (දීප., 1970:22). එමෙන් ම සංඝතිස්ස රජු (ක්‍රි.ව).

මෙසේ ධාතුසේන රජු (ක්‍රි.ව. 459-477) විසින් සෑ තුනෙහිම දිරා ගිය ඡත්‍ර කරවා තිබේ (මව. 38:54-55). මහානාග රාජ්‍ය (ක්‍රි.ව. 573-575) සමයේ මහා චෛත්‍ය තුනෙහි ම හුණු ආලේපකරවා 247-251) විසින් ස්තූපයේ උපරිභාගයේ සිදු කරන ලද ප්‍රධානතම කාර්යය නම් ස්වර්ණමය ඡත්‍ර කරවීම හා මාණික්‍යමය ශිඛා ථූපයක් කරවීම[34] යි. 'චම්බටකය'[35] ද 'හත්ථිවේදිය' ද ඒවායේ චිත්‍රකර්මයන් ද කරවූ බව මහාවංසය පෙන්වා දෙයි (40:95-96). පරණවිතාන මහතා පෙන්වා දෙන ආකාරයට මේ 'හත්ථිවේදිය' නම් හස්ති ප්‍රාකාරය නොව, තෙවන පේසාව මත පිටට නෙරන ලෙස පිහිටුවන ලද හස්ති හිස් රූප පෙළ යි (2005, 15). පසුකාලීන සංවර්ධන ක්‍රියාකාරකම් හේතුවෙන් රුවන්වැලි ස්තූපයෙන් මෙම හත්ථිවේදිය විතැන් වී ඇති මුත් ස්මිදර් විසින් මෙය සැළසුම් ද සහිතව (සැලසුම 02) වාර්තාකර තිබේ (1993, plate XXVII). පළමුවැනි අග්ගබෝධි රජු (ක්‍රි.ව.575-608) විසින් රුවන්වැලි සෑයෙහි රන්මුවා ඡත්‍රයක් කරවූ බව මහවංසය පෙන්වා දෙයි (41:33-34). මෙසේ දෙවන කාශ්‍යප රජු (ක්‍රි.ව. 650-659) විසින් ද මල්වතු, පොල්වතු හා වැව් කරවා මේ ප්‍රධාන ස්තූපයන් තුනට පූජා කර තිබේ (මව., 42:145-146). මීට අමතරව

32 කිඤ්චික්ඛ පාසාණ යන්න උගතුන්ගේ විමසුමට භාජනය වූ වදනකි. පරණවිතාන මහතා පෙන්වා දෙන්නේ රුවන්වැලි පේසාවේ සිට අඩි 25ක් පමණ පිටට විහිදෙන සීමාවේ කරවූ ගල් ඇතිරුමක් බවයි (2005, 56). මොහුගේ මෙම මතය සඳහා වංසත්ථප්පකාසිනියේ අර්ථගැනවීම (1994, 510) බෙහෙවින් හේතු වී ඇත. ඒ.ඇස්. හෙට්ටිආරච්චි මහතා ද පරණවිතාන අදහසට එකඟතාවක් පළකර ඇතැයි සිතේ (හෙට්ටිආරච්චි 2009:42). කරුණාසේන හෙට්ටිආරච්චි මහතාගේ මතය නම් මෙය පේසාව හා සලපතල මළුව වෙන් කරන සීමාවේ වූ වැලි කොන්ද විය හැකි බව යි (එම., 2009:43).

33 මේ නම් පෙර පෙර භාතිකාභය රජු විසින් කරවූ පිළිකඩ දෙකම විය යුතු ය. පරණවිතානයන් පෙන්වා දෙන අකාරයට මේවා මුලින් නිර්මාණය කර තිබුනේ දැවයෙන් විය යුතුය. එනිසා මුල් පාලකයා නිර්මාණය කර කෙටි කලෙකින් ම නැවත ඒවා නිර්මාණය කිරීමට සිදු වී ඇත (පරණවිතාන, 2005, 57). මන් ද මේ දෙදෙනා පිළිබඳව ම පැවසීමේ දී පෙන්වා දෙන්නේ ඒවා නිර්මාණය කළ බවකි.

34 ස්තූපයට සෙන නොවනදින්නට මේ නිර්මාණය සිදු කරන ලද බව වංසත්ථප්පකාසිනිය (1994, 538), පරණවිතාන මහතා (2005, 32) හා හෙට්ටිආරච්චි මහතා (2009, 45) විසින් ද පෙන්වා දෙයි.

35 මෙම වචනයෙහි අර්ථය සම්බන්ධයෙන් විද්වතුන්ට මෙතෙක් නිශ්චිත අදහසක් නොමැත.

සිලාමේඝවණ්ණ රජු (ක්‍රි.ව. 623-632) හා පළමුවැනි දප්පුල රජු (ක්‍රි.ව. 659) විසින් මහා ථූපයට සත්කාර කළ බව පමණක් සඳහන් කරයි (මව., 42:65; 46:121-122).

[redacted]

සැලසුම 02: රුවන්වැලි ස්තූපයේ තෙවන පේසාව මත තිබූ ඇත් රූ හිස් පේළිය (Smither, 1894, plate XXVII)

දකුණු ඉන්දීය ආක්‍රමණයන් හමුවේ අස්ථාවර භාවයට පත් අනුරාධපුර නගරය නැවත ස්ථාවර වන්නේ පොළොන්නරු අවධියේ දී ය. මෙහි පුරෝගාමීත්වය ගත් පළමු විජයබාහු රජු විසින් අනුරාධපුරයෙහි අභිෂේක පවත්වා රාජධානිය පොළොන්නරුවටම කේන්ද්‍ර කර ගනිමින් ක්‍රියාත්මක කරන්නට වූ නමුත් ස්තූප සම්බන්ධයෙන් මැදිහත්වීම් සිදු කළ බවක් වංසකතාව පෙන්වා නොදෙයි. ඒ හේතුවෙන් නැවත වරක් අනුරාධපුරයේ මහා ස්තූප සම්බන්ධයෙන් අවධානය යොමු කරන පාලකයා ලෙසින් වංසකතාව ඉදිරිපත් කරන්නේ පළමු පරාක්‍රමබාහු රජු (ක්‍රි.ව. 1153-1186) ය. අස්වාමික හෙයින් වගවලසුන් හා දිවියන්ගේ ලැගුම්හල් වූ අනුරාධපුරයේ මහාවිහාර ආශ්‍රිත ස්තූප කෙරෙහි රජුගේ ප්‍රමුඛ අවධානය යොමු ව තිබේ. එහි දී දෙමළුන්[36] හා වෙනත් කර්මාන්ත ශිල්පීන් යොදවා ගනිමින් මේ ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කළ අතර, එම කටයුතු නිරීක්ෂණය සඳහා වෙනම අමාත්‍යවරුන් ද පත් කර ඇත (එම., 104-106). දාගැබ 120 රියනක් උස් කොට බඳවා සුනු පිරියම් කළ බව පැහැදිලිවම දක්වා තිබේ. හාත්පස භූමි ප්‍රදේශය ද මනා ලෙස ශුද්ධ පවිත්‍ර කරවා සමස්ත ප්‍රතිසංස්කරණ කටයුතු හමාර කිරීමෙන් පසු ලංකාවේ විවිධ දෙසින් වැඩම කරවන ලද භික්ෂූන් වහන්සේලා පෙරටු කොට ගෙන රජු විසින් සෑයේ කොත පැළඳවීම උත්සවාකාරයෙන් සිදු කොට ඇත (එම.,76:104-122). ඔහුගෙන් අනතුරුව පැමිණි නිශ්ශංකමල්ල රජු පිළිබඳ සෙල්ලිපි මූලාශ්‍රයන් හි බොහෝ තොරතුරු සඳහන්ව තිබේ. මේ රජු විසින් රුවන්වැලි ස්තූපය වෙනුවෙන් මහාපරිමාණ පූජාවන් සිදු කළ බව පෙන්වා දෙන පොළොන්නරුව ගල්පොත පුවරු ලිපිය (EZ., II, 1985, 106-107) එතුමාගේ ධනයෙන් ලක්ෂ තිස් හතක් (සතිස්ලක්ෂයක් ධන වියදම් කොටැ.....) වියදම් කර පූජා කරවූ බව පෙන්වා දෙයි. මේ මුදල් වැය කලේ ප්‍රතිසංස්කරණ කටයුතු වෙනුවෙන් ද නොඑසේ නම් එහි වැඩිදියුණුව වෙනුවෙන් ද යන්න නිශ්චිතව ශිලා ලේඛනයෙහි නොදක්වයි. තව ද එම ලිපියෙහි දක්වන්නේ පූජා පවත්වා ආශිර්වාද කළ තැන ශිලාමය දාගැබක් කරවූ බවයි (EZ., II, 1985, 107). බොහෝ දුරට මෙය රුවන්වැලි ස්තූප මළුවේ ඇති ශිලාමය කුඩා ස්තූපය විය හැකි ය. මෙම ප්‍රධාන පාලකයන් දෙදෙනා හැරෙන්නට පොළොන්නරු අවධියේ වෙනත් කිසිඳු පාලකයෙක් රුවන්වැලි ස්තූපය සම්බන්ධයෙන් මැදිහත්වීම් සිදු කළ බවක් සඳහන් නොවේ.

රාජධානි නිරිත දෙසට සංක්‍රමණය වෙත් ම අවධානයෙන් තොර වූ අනුරාධපුරයේ ස්තූප වැඩි අවධානම් තත්ත්වයකට මුහුණ දෙන්නට විය. මෙම වාතාවරණය මදකට හෝ සමනය කිරීමේ මූලිකත්වය ගත් පාලකයන් දෙදෙනෙක් ලෙස දඹදෙණි රජධානි අවධියේ දෙවන පරාක්‍රමබාහු (පණ්ඩිත පරාක්‍රමබාහු) රජු (ක්‍රි.ව. 1236-1270) හා සිව්වන විජයබාහු (බෝසත් විජයබාහු) රජු (ක්‍රි.ව. 1270-1272)

36 ''දෙමළුන් විසින් පූර්වයෙහි බිඳිනාලද ලක්දිව්හි සියලු සෑ උන් ලවාම කරවිය යුතුය'' යි සිතා ලංකාධිපති විසින් ඇණවූ කල සමහරුන් ලක්දිවට පමුණුවා රුවන්වැලි සෑයෙහි කර්මාන්ත කරවීය (මව., 104-106).

පෙන්වා දිය හැකි ය. දෙවන පරාක්‍රමබාහු රජු විසින් රජරට කලාපය විලෝපනය කිරීමෙහි නිරතව සිටි මාඝ (ක්‍රි.ව. 1215-1236) පලවා හැරීමෙන් පසු රුවන්වැලි ස්තූපය ආදී ආගමික ස්ථාන පිළිසකර කිරීම් කටයුතුවල නිරත වූ බව ප්‍රකාශිත ය (කුලතුංග, 2011, 13). ස්වකීය පිය රජු (දෙවන පරාක්‍රමබාහු රජු) ආරම්භ කොට නිමවා ගත නොහැකි වූ ප්‍රතිසංස්කරණ කටයුතු යළි පණගන්වා ගනිමින් එම කාර්යය සඳහා යොමු වී සිටි කර්මාන්ත ශිල්පී කණ්ඩායම් නැවත ක්‍රියාත්මක කරවයි (මව., 88:83-88). ඉන් අනතුරුව සමයේ කිසිඳු රජ කෙනෙක් රුවන්වැලි ස්තූපයේ වැඩිදියුණුව වෙනුවෙන් කටයුතු කළ බවක් මූලාශ්‍රයෙහි සඳහන් නොවේ. නැවත වතාවක් අනුරාධපුර රුවන්වැලි ස්තූපයේ වැඩිදියුණුව වෙනුවෙන් සිදු කරන ලද කටයුතු පිළිබඳව සාකච්ඡා වන්නේ යුරෝපා ජාතීන් මෙරටට පැමිණීමෙන් අනතුරුව කාල පරිච්ඡේදයේ දී ය.

## අභයගිරි දාගැබ සඳහා විවිධ මැදිහත්වීම්

පෙර සඳහන් කළ පරිදි වළගම්බා, ගජබා රජවරුන්ගේ අභයගිරි දායකත්වයෙන් අනතුරුව ඒ සම්බන්ධයෙන් මැදිහත් වූ පළමුවැන්නා බවට පත් වන්නේ දෙවන භාතික තිස්ස රජතුමා (ක්‍රි.ව. 143-167) ය. අභයගිරියෙන් හමු වූ ශිලා ලේඛනයකට අනුව මොහු 'අබය උත්තර මහා චේතියට' එකසිය අට කරීසයක[37] කුඹුරු පූජාවක් සිදු කොට ඇත්තේ එහි කැඩුම් බිඳුම් පිළිසකර කිරීම සඳහා ය (වජිර හිමි, 1994, 12-16). ගජබා රජුගෙන් වසර හතක් පමණ කාලයක් ඉක්ම ගිය පසු මෙබඳු අති විශාල පූජාවක් සිදු කරන ලද්දේ ඇතැම් විට ඒ සමය වන විට පිළිසකර කළ යුතු තත්ත්වයට ස්තූපය පත්ව තිබූ නිසා විය හැකිය. නමුත් ඉහතින් පෙන්වා දෙන ආකාරයට අභයගිරි ස්තූපය කරවන ලද්දේ ගජබා රජු විසින් නම් දෙවන භාතික රජු එහි පිළිසකර කටයුතු වෙනුවෙන් මෙපමණ ආදායම් කලාපයක් වෙන් කළ යුතු නොවේ. එහෙයින් අභයගිරියේ නිමැවුම් කරුවා වළගම්බා රජුම බව තීරණය කිරීමේ සාධක ද මේ ලිපියෙන් සපයයි. ඇතැම් විට කුඩා ප්‍රමාණයෙන් නිර්මාණය කරන ලද අභයගිරි දාගැබ මහාපරිමාණ කරන ලද ගජබා රජුගේ වැය පාර්ශ්වය සළකා කල් ඇතිවම මෙබන්දක් වෙන් කිරීමට කටයුතු කලා ද විය හැකි ය (හෙට්ටිආරච්චි 2009:68-70). මෙම අදහස තවදුරටත් සනාථ කිරීමෙහි සමත් ශිලා ලේඛනයක් අභයගිරි දාගැබ් දකුණු ආයකය අසළින් අනාවරණය වී ඇත. එම ලිපිය අයිති වන්නේ දෙවන භාතික තිස්ස රජුගේ සොයුරු කණිට්ඨතිස්ස රජුට (ක්‍රි.ව. 167-186) ය. මීට අනුව රජු විසින් අභයගිරියේ **කරවිඩකය කරවා ඡත්‍ර නංවා ආයක සතර ද කරවා තිබේ** (IC., II, 2001, 152). නමුත් මහාවංසය හා දීපවංසය යන මූලාශ්‍රද්වය ම මේ කාරණය සම්බන්ධයෙන් නිහඬ ය. මෙම ලිපියට අනුව කණිට්ඨතිස්ස රජු විසින් ද කුඹුරු හා වැව්වලින් ලැබෙන බදු මුදල් අභයගිරි විහාරයට පරිත්‍යාග කරවා ඇත. මෙහි **'කරවිඩකය කරවා'** යන්න විමසීමට බඳුන් කරන හෙට්ටිආරච්චි මහතා පෙන්වා දෙන්නේ වළගම්බා රජු විසින් කරවූ කරවිඩකය දෙවන භාතික තිස්ස රජු තිබූ පරිදිම ප්‍රතිසංස්කරණය කර ඇති නමුත් කණිට්ඨතිස්ස රජු එය ඉවත් කර (ප්‍රමාණාත්මකව විශාල වූ ස්තූපයට ගැලපෙන ලෙස) නව කරවිඩකයක් කරවන්නට ඇති බව යි (2009, 70).

**'ආයක සතර ද කරවා'** යන්න ද සැළකිල්ලට භාජනය කළ යුතු වදනකි. මුලින් 'වාහල්කඩ' යන වචනය භාවිත කළ පරණවිතාන මහතා ද මෙම ලිපියෙන් අනතුරුව මේ සඳහා වඩාත් සුදුසු වචනය ලෙස තෝරා ගන්නේ අයක හෙවත් ආයක යන වචනයයි (2005, 38). මොහු විසින් ආයක නිර්මාණය කිරීමට පළමුව ආදිමුඛ නමින් වූ සරළ නිර්මාණයක් පැවති බවත්, පසුව එය ආයක ලෙසින් ස්ථිර ව ගොඩනැගූ බවත් ඇතැමුන්ගේ විශ්වාසයයි (කුලතුංග, 2004(අ), 2). මහාවංසය ගජබා රජ (ක්‍රි.ව. 112-134) කතා පුවතේ දී මේ කරුණ සනාථ කරයි[38]. මහාවංස විස්තරය කරණකොට ගනිමින් කඹුරුපිටියේ වණරතන හිමියන් පෙන්වා දෙන්නේ මේවා වාහල්කඩ ද නොඑසේ නම් තොරණ ද යන්න අවිනිශ්චිත බවකි (1970, 96). මෑතකාලීන පර්යේෂණ හමුවේ අභයගිරි උතුරු ආයක කැණීමෙන් යටින් පැවති ආයකයකට සමාන සරළ ඉදිකිරීමක සාධක අනාවරණය වූ බවත් ඒවා පැරණි ආදිමුඛ විය හැකි බවත්, හෙට්ටිආරච්චි මහතා පෙන්වා දෙයි (2009, 71). අභයගිරි දාගැබ සම්බන්ධයෙන් ඉන් අනතුරුව සමයේ

---

37 මෙය වර්තමාන මිණුම් ඒකක අනුව කුඹුරු අක්කර 864ක් බව හෙට්ටිආරච්චි මහතා පෙන්වා දෙයි (2009, 69).

38 .......අභයගිරි මහ සෑය මහත් කොට බැඳවී. එහිම සතර දොරටු යෙහි ආදි මුඛ නොහොත් තොරණ කරවී .......(35:119). මධ්‍යම සංස්කෘතික අරමුදලෙහි අභයගිරි විහාර ව්‍යාපෘතියෙහි පළමුවන වාස්තුවිද්‍යා සංරක්ෂණ වාර්තාවෙහි (1981) පෙන්වා දෙන්නේ අභයගිරිය වර්තමාන තත්ත්වයට විශාල කොට බඳවන ලද්දේ මේ කාලසීමාවේ දී බවයි (1993, 6).

විවිධ පාලකයන් විසින් අවධානය යොමු කොට ක්‍රියාත්මක වූ ආකාරය පහතින් සංක්ෂිප්තව විස්තර කර ඇත (වගුව 02).

| රාජ්‍ය කාලය | පාලකයා | සිදු කරන ලද කාර්යය |
|---|---|---|
| ක්‍රි.ව. 164-192 | කණිට්ඨතිස්ස රජු | දාගැබෙහි වාහල්කඩ ඉදිකර දකුණු වාහල්කඩෙහි ස්වකීය බිසවගේ හා මව් බිසවගේ භෂ්මාවශේෂ තැන්පත් කර තිබේ (වික්‍රමසිංහ, 1993, 6). |
| ක්‍රි.ව. 209-231 | වෝහාරිකතිස්ස රජු | දැගැබෙහි ඡත්‍ර නැංවූ බව (මව., 36:33; දීව., 22:38). |
| ක්‍රි.ව. 276-303 | මහසෙන් රජු | ජේතවන ස්තූපය ඉදිකලා පමණක් නොව අභයගිරිය වෙනුවෙන් අනුග්‍රාහකත්වයන් සැපයූ බව (වික්‍රමසිංහ, 1993, 6). |
| ක්‍රි.ව. 428-429 | මිත්තසේන රජු | දාගැබ් තුනෙහි ම ඇත් පවුර හා තොරණ කරවූ බව (මව., 38:10). වර්තමානයේ දී මේ ඇත් පවුර දැක ගත නොහැක. |
| ක්‍රි.ව. 455-473 | ධාතුසේන රජු | දාගැබ් තුනෙහිම හුණු ආලේප කිරීම, රණින් ඡත්‍රයක් කරවීම හා පළිඟු සුඹුලුවක් කරවීම (මව., 38:74). අභයගිරි පරිශ්‍රයේ ස්මාරක බොහෝ ප්‍රමාණයක් ප්‍රතිසංස්කරණය කරන ලද බව (වික්‍රමසිංහ, 1993:. |
| ක්‍රි.ව. 569-571 | මහානාග රජු | මහ සෑ තුනෙහි ම හුණු ආලේප කිරීම, පළිඟු සුඹුලුවක් කරවීම, හත්ථිවේදිය කිරීම හා සිතුවම් ඇන්දවීම (මව., 40:95). |
| ක්‍රි.ව. 614 | දෙවන සංඝතිස්ස | දාගැබ් තුනම අලුත් වස්ත්‍රවලින් ආවරණය කළ බව හා මහා පූජා පැවැත්වූ බව (මව., 42:44). |
| ක්‍රි.ව. 619-628 | ශිලාමේඝවර්ණ | දාගැබ් තුනටම සත්කාර කළ බව මහාවංසය කියයි (මව., 42:44). එහෙත් ඒවා කවරාකාරයේ සත්කාර දැයි පැහැදිලි නැත. |
| ක්‍රි.ව. 777-797 | දෙවන මිහිඳු | දාගැබ් තුනටම සත්කාර කළ බව මහාවංසය කියයි (මව., 46:122). ඒවා කෙසේ දැයි අපැහැදිලි ය. |
| ක්‍රි.ව. 898-914 | හතරවන කාශ්‍යප | භගිරිනකා නම් (අභයගිරි) දාගැබ ප්‍රතිසංස්කරණය කරයි (පූව., 1997, 781). රියන් 140ක් උසට දාගැබ බඳවා එහි ගර්භය තුළ ධර්ම ධාතුව තැන්පත් කළ බව සද්ධර්මරත්නාකරය පෙන්වා දෙයි (1995, 359). |
| ක්‍රි.ව. 938-946 | තුන්වන සේන | සතලිස් දහසක් ධනය[3] වැය කර අභයගිරි දාගැබ් මළුවේ ගල් ඇතිරවීම කළ බව (මව., 54:33). |
| ක්‍රි.ව. 956-972 | හතරවන මහින්ද | අභයගිරි විහාරයේ දාගැබ හා අනෙකුත් ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කළ බව ජේතවනාරාම පුවරු ලිපියක තොරතුරු සඳහන් වේ (ශිලා ලේඛන සංග්‍රහය, 2000, 118-124; 108-117). |
| ක්‍රි.ව. 1153-1186 | මහා පරාක්‍රමබාහු රජු | අනුරාධපුරයේ මහා විහාර ප්‍රතිසංස්කරණ කාර්යය සඳහා සේනාපතියෙකු යොදවන ලදි. එකසිය හතලිස් රියන් උස අභයගිරි දාගැබ සම්පූර්ණයෙන් ම පිරිසිදු කොට හුණු පිරියම් කළ බව (මව., 78:101-106). |

| | | |
|---|---|---|
| ක්‍රි.ව. 1747-1781 | කීර්ති ශ්‍රී රජසිංහ | .......... මෙහි දී රජ තෙමේ ශ්‍රී මහා බෝධීන් වහන්සේ ට ද චෛත්‍යයන්ට ද ඇතුන්, අසුන්, රන් හා රිදී වැනි වටිනා දේ පූජා කරමින් ........ (මැද්දේගම, 2002, 46). මෙහි චෛත්‍යයන් යනුවෙන් සඳහන් කරන බැවින් එයින් අනුරාධපුරයේ මහා ස්තූප සියල්ලක් නියෝජනය වෙතැන් උපකල්පනය කළ හැකිය. |

වගුව 02: අභයගිරි ස්තූපය සම්බන්ධයෙන් විවිධ පාලකයන්ගේ මැදිහත් වීම්

**ජේතවන දාගැබ සඳහා විවිධ මැදිහත්වීම්**

කිත්සිරිමෙවන් රජුගෙන් අනතුරුව ද විවිධ රජවරුන් විසින් ජේතවන විහාරයේත් ස්තූපයේත් කටයුතු වෙනුවෙන් යොමු වූ බව වංසකතාමය තොරතුරු සාක්ෂ්‍ය සපයයි. එසේ මිත්තසේන රජු (ක්‍රි.ව. 428-429) විසින් ස්තූපයේ ඇත් පවුර හා තොරණ කරවූ බව මහාවංසය විස්තර කරයි (මව., 38:10). දැනට ස්තූපයට යාබදව ඇත් පවුරක් පිළිබඳව සාධක නොමැති නමුත් ඒ සඳහා සුදුසුම ස්ථානය ලෙස සලපතල මළුවත්, වැලි මළුවත් වෙන් වන සීමාවේ වූ පනා බැම්මේ පිටත මුහුණතේ පිහිටිය හැකි යයි විශ්වාස කළ හැක්කේ රුවන්වැලි ස්තූපයේ පැරණි හස්ථි ප්‍රාකාරයේ සාධක දැනුදු හඳුනා ගත හැකි බැවිනි. මෙය සනාථ කරන සාධකයක් 1984 කැණීම් වාර්තාවක් පෙන්වා දෙයි. ඊට අනුව ස්තූපයේ නැගෙනහිර දොරටුව අසළ පවුරේ ඇත් රුවක පාදයක කොටසක් අනාවරණය කර ගැනීමට හැකියාව ලැබී ඇත (Rathnayake, 1984, 20).

ධාතුසේන රජුගේ (ක්‍රි.ව. 455-473) හා මහානාග රජුගේ (ක්‍රි.ව. 569-571) ස්තූප සම්බන්ධයෙන් මැදිහත් වීම්වල දී ජේතවන ස්තූපය ද ප්‍රධාන තැනක් ගෙන තිබේ (වගුව 02). මහානාග රජු විසින් ජේතවන විහාරයට උඩුගම් හි වැහැප් නම් ගමක් පරිත්‍යාග කර තිබේ (මව.40:97). මේ හැරෙන්නට පළමු අග්ගබෝධි රජු (ක්‍රි.ව. 571-604) විසින් දාගැබෙහි ඡත්‍ර රණින් කරවූ බව සඳහන් වේ (එම.41:32). දෙවන සංඝතිස්ස රජුගේ (ක්‍රි.ව. 614) හා ශිලාමේඝවර්ණ රජුගේ (ක්‍රි.ව. 619-628) සත්කාරය ලැබූ විහාර අතර ජේතවන විහාරයත් විශේෂයෙන් එහි ස්තූපයත් වේ (වගුව 02). තුන්වන ජෙට්ඨතිස්ස රජු (ක්‍රි.ව. 628-629) විසින් ජේතවන විහාරයට 'ගොඩිගමුව' නම් ගමක් පූජා කර තිබේ (එම.42:97). ඔහුගෙන් පසු දෙවන වර රාජ්‍යත්වයට පත් තුන්වන අග්ගබෝධි රජු (ක්‍රි.ව. 629-639) මෙම විහාරයට 'මාමිණියා' නම් ගමක් පරිත්‍යාග කර ඇත (එම., 42:121). සීගිරි ගීවල ද මහමිණිවිය[39] නම් ගමක් පිළිබඳව කියැවේ (සී. 658). හෙට්ටිආරච්චි මහතා පෙන්වා දෙන්නේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ වර්තමාන මාමිණියාව යන ගම මෙය විය හැකි බව යි (2009, 117). දහවන සියවසේ අවසාන භාගයේ සිව්වන මිහිඳු රජු (ක්‍රි.ව. 956-972) ගේ කාලයේ දී ජේතවන ස්තූපයේ නවකම් කටයුතු වෙනුවෙන් භික්ෂූන් වහන්සේලා මැදිහත් වූ ආකාරය පිළිබඳ ඉතා හොඳ විස්තරයක් මහාපාලිය අසල ශිලා ලේඛනයකින් සනාථ වේ. ඊට අනුව 'මෙ මහ පෙළ බත් ගන්නා තාක් දෙනමෝ අප ලද බත් කොටස් බත් දෙනාවෙහෙර දාගැබ කරන කම් නවාමට දුන් මෝ ........ ' (EZ., vol III, 1989, 132-133) යනුවෙන් පෙන්වා දෙයි. මහාපාලි දානශාලාවෙන් නියමිත සලාකය ලබා ගත් භික්ෂූන් වහන්සේලා පිරිසක් විසින් ස්වකීය දාන කොටස ජේතවන ස්තූපයේ අලුත්වැඩියා වෙනුවෙන් පූජා කරන ලද බව ඉන් කියැවේ.

පස්වන මිහිඳු රජුගේ (ක්‍රි.ව. 982-1029) කාලයේ දී ඇති වූ චෝළ ආක්‍රමණයත් සමග අනුරාධපුරයේ මහත් සංහාරයක් ඇති විය. මෙනිසා සෑම ස්තූපයකටම ද හානි පැමිණුන බව මහාවංසය විස්තර කරයි.

> **"තුන් නිකායි දාගැබ් ද මුළු ලක්දිව් තෙලෙහි නොයෙක් ස්වර්ණාදී පිළිබිඹු ද එසේම ඒ ඒ වෙහෙර සියල්ල ද ලා හෙලා බිඳගෙන ඕජස් උරන යකුන් සෙයින් ලක්දිව් හි සාරය ගත්හ"** (මව., 55:1822).

මෙම තත්ත්වය හමුවේ අනුරාධපුරයේ භික්ෂු ශාසනය රඳවා ගැනීමේ දැවැන්ත අභියෝගයකට ද භික්ෂූන් වහස්සේලා මුහුණ දෙයි. කෙසේ නමුත් අවසානයේ දී මෙකී වාතාවරණය වෙනස් කිරීමේ භාරදූර කාර්යය පළමු පරාක්‍රම බාහු රජු (ක්‍රි.ව. 1153-1186) විසින් දියත් කරන්නට වූ බව මුලින් ද සඳහන්

39 මහමිණිවියෙන් ආ සලමෙය් දෙවමි (මෙ ගිය ලීමි) ............ (Sigiri Graffity, 1956, 405).

කොට ඇත (වගුව 02). ඔහුගේ සමයේ දී එකසිය හැට රියනක් උසට ජේතවන දාගැබ පිළිසකර කර සුණුකම් කරවා මළුව ද ශුද්ධ පවිත්‍ර කළ බව (මව., 78:100-105) පැවසේ. රුවන්වැලි සෑ මළුවෙන් හමු වූ පළමු පරාක්‍රමබාහු රජුට අයත් සෙල් ලිපියක ද රජු විසින් ජේතවන දාගැබ පිළිසකර කළ බව සඳහන් කරයි (හෙට්ටිආරච්චි, 2009, 119). පොළොන්නරු යුගයෙන් අනතුරුව මෙරට රජවරුන් විසින් වැඩි අවධානයක් ජේතවන දාගැබ සම්බන්ධයෙන් යොමු වූ බවක් මූලාශ්‍රය විස්තර නොකරයි. දඹදෙණි අවධියේ තුන්වන විජයබාහු රජුගේ පාලන සමයේ දී වැව් බැඳි රාජ්‍යයේ පිහිටි ස්මාරක 20කට අධික සංඛ්‍යාවක් පිළිසකර කළ බව ඓතිහාසික මූලාශ්‍රවල සඳහන් වෙතත් ඒ මොනවා දැයි නිශ්චිතව සඳහන් නොකරයි. මේ ස්මාරක අතරට අනුරාධපුරයේ මහා ස්තූප ද අයත් විය හැකි බව විමලරත්න පවසයි (2009, 198). මහනුවර රාජධානි අවධියේ ශ්‍රී විජය රාජසිංහ (ක්‍රි.ව. 1739-1747) විසින් අනුරාධපුරයේ මහා පුදපූජා පැවැත්වූ බව (මව., 98:87) සඳහන් වෙතත් ඒ කුමන ආරාමයක දැයි නිශ්චිත නොවේ. කීර්ති ශ්‍රී රාජසිංහ රජු (ක්‍රි.ව. 1747-1781) අනුරාධපුරයේ චෛත්‍යයන්ට පූජා පැවැත් වූ බව (වගුව 02) සඳහන් වෙතත් මූලාශ්‍රයන් හි ඒ පිළිබඳ විස්තරාත්මක සඳහනක් නොකරයි (එම., 99:36-37).

## සමෝධානය

ශ්‍රී ලංකාවේ බුදු සසුන ස්ථාපිත වීම සඳහා බලපෑවා සේම මෙරට ස්තූප ඉදි කිරීම කෙරෙහි ද ඉන්දියාවෙන් ආභාසය ලැබී තිබේ. හුදෙක් බෞද්ධ සංකල්පයක් ලෙසින් ම නොවී වෙනත් ආගමික සංස්ථාවන් හි ද වන්දනාවට පාත්‍ර වූ ස්තූපය මෙරටට පැමිණෙන්නේ සම්පූර්ණයෙන් ම බෞද්ධකරණයට ලක් වීමෙනි. භූගෝලීය වශයෙන් විශාල භූ වපසරියක් නියෝජනය කරන ඉන්දියාවේ බහුවිධ ආගමික දෘෂ්ඨීන් පැවති හෙයින් බෞද්ධාගමට සේම ස්තූප කෙරෙහි ද වැඩි අවධානයක් යොමු වූ බවක් හඳුනා ගත නොහැක. ශ්‍රී ලංකාවේ ස්තූප ඉදි කිරීමේ ආරම්භක අවස්තාව ඉන්දියානු ස්තූප ඉදිකරන කාලසීමාවට සමකාලීනව මෙන්ම ඉන් අනතුරුව ද සිදු වූ අයුරු හඳුනාගත හැකි ය. දෙවනපෑතිස් රජ දවස මිහිඳු මහරහතන් වහන්සේගේ උපදෙස් පරිදි ථූපාරාමයේ මුල්ම ස්තූපය කුඩා ප්‍රමාණයෙන් වුව ඉදිකිරීමෙන් මෙරට ස්තූප වංසකතාව ආරම්භ වෙයි. ඉන් අනතුරුව සමයේ පමාණයෙන් විශාල ස්තූප ඉදිකිරීම කෙරෙහි පාලක අවධානය යොමු වී ඇත. යුධ ජයග්‍රහණයෙන් ලැබූ උසස් මානසික වින්දනය අවසන දුටුගැමුණු රජු විසින් මුල්ම මහා දාගැබ් දෙකෙහිම නිර්මාපකයා වූයේ ය. ඉහතින් සාකච්ඡාවට බඳුන් කළ අන්දමින් වළගම්බා රජු හෝ පළමු ගජබා රජු විසින් තෙවන විශාලතම දාගැබ ලෙස අභයගිරි දාගැබ කරවයි. අනෙක නම් මහසෙන් රජු විසින් තැනවීමට ඇරඹූ ජේතවනාරාම ස්තූපය යි. පාලකයාගේ ප්‍රබලත්වය මෙන්ම රටේ පැවති ආර්ථික දේශපාලන හා සමාජයීය ස්ථාවරත්වයන් හමුවේ මෙසේ ඉදිකරන ලද ස්තූප සම්බන්ධයෙන් ඇති වූ පශ්චාත් අභියෝගය වූයේ ඒවා පවත්වාගෙන යාමයි. අති දැවැන්ත නිර්මාණ ලෙස ඉදිකරන ලද මේවා ඉතා හොඳින් පවත්වාගෙන යාම පසුකාලීන පාලකයන්ට අභියෝගයක් වූ පව පසුකාලීන මැදිහත්වීම් වඩාත් සූක්ෂම අයුරින් පිරික්සීමේ දී පෙනී යයි. තව ද අනුරාධපුර රාජධානියේ පරිහානිය සිදුවෙත්ම අස්වාමික වූ අනුරාධපුර ප්‍රදේශයේ අති දැවැන්ත නිර්මාණ වූ මහා ස්තූප පද්ධතියේ ද හායනය ආරම්භ විය. පසු අවස්ථාවන්හි අතලොස්සක් වූ පාලක පිරිස් ඒවායේ ආරක්ෂාව වෙනුවෙන් මැදිහත් වුව ද දිනෙන් දින සිදු වූයේ මෙම නිර්මාණයන් හි හායනයයි. ඓතිහාසික අතින් වැදගත් ප්‍රථම හා ද්විතීයික මූලාශ්‍ර ද පුරාවිද්‍යාත්ම ලේඛනයන් හි තොරතුරු ද උපයෝගී කර ගනිමින් මාතෘකානුගතව අනුරාධපුරයේ මහා ස්තූප සම්බන්ධයෙන් වූ පසුකාලීන මැදිහත් වීම් පිළිබඳව සවිස්තරාත්මක කථනයක් මෙහි දී ඉදිරිපත් කර තිබේ.